# නායයෑම් ආපදා අවමකරණය තුළින් නායයෑම්වලට ගොදුරු වීමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය

## ආපදා අවදානම් ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම

**නායයාම් අපදා අවදානම් ස්ථානීය අංක 104**

**දෙනියාය රෝහල**

**මාතර දිස්ත්‍රික්කය**

**නොවැම්බර් 2022**


ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
99/1, ජාවත්ත පාර, කොළඹ 05
දු.ක. 011 2588946 / 011 2503826 / 011 2503431

## පටුන


1. හැඳින්වීම .................................................. 1

1.1 ව්‍යාපෘතිය පිලිබඳ විශ්ලේෂණය .................................................. 1

1.2 අපේක්ෂිත පරිශීලකයින් .................................................. 1

2. ව්‍යාපෘතිය පිළිබඳ හැඳින්වීම හා ආපදා ස්ථානීය තොරතුරු .................................................. 1

2.1 ව්‍යාපෘතියේ නම .................................................. 1

2.2 ස්ථානීය තොරතුරු .................................................. 1

2.3 භූ ලක්ෂණ සහ භූමියේ අයිතිය .................................................. 2

2.4 ප්‍රදේශයේ කාලගුණ තොරතුරු .................................................. 3

3. නායයාම් ආපදාව සම්බන්ධ තොරතුරු .................................................. 3

3.1 නායයාම් ආපදාවේ ස්වභාවය .................................................. 3

3.2 නායයාමෙන් සිදුවන බලපෑම හා එයින් ඇතිවන ප්‍රතිඵල .................................................. 4

3.3 පවතින අවදානම අවම කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග .................................................. 4

3.4 තාවකාලික ඉවත් කිරීම් .................................................. 4

3.5 නැවත පදිංචි කිරීම (ප්‍රගතිය) .................................................. 4

4. නායයෑම්/ භූ අස්ථාවර වූ ප්‍රදේශය, අවට ප්‍රදේශය පිලිබඳ විස්තර සහ වර්තමාන අවදානම් මට්ටම .................................................. 6

4.1 භූමි අස්ථාවරත්වය සිදුව ඇති ප්‍රදේශය අවට තොරතුරු .................................................. 6

4.2 වර්තමාන අවදානම් ස්වාභාවය .................................................. 6

5. යෝජිත පිළිසකර කිරීමේ ක්‍රියා මාර්ගයන් .................................................. 6

6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්වන අවට පරිසරයේ සංවේදී ඒකක පිලිබඳ කෙටි හැඳින්වීම .................................................. 6

7. ව්‍යාපෘති ප්‍රදේශය හා සම්බන්ධ සමාජ, පාරිසරික බලපෑම් සහ අවදානම් හඳුනා ගැනීම .................................................. 7

7.1 හිතකර බලපෑම් .................................................. 7

7.2 අහිතකර බලපෑම් .................................................. 8

7.2.1 ජල විද්‍යාත්මක බලපෑම් .................................................. 8

7.2.1.1 ප්‍රදේශයේ ජලාපවහන රටාවට සිදුවිය හැකි බලපෑම් .................................................. 8

7.2.1.2 ජල දූෂණය මගින් සිදුවිය හැකි බලපෑම් .................................................. 8

7.2.1.3 ඛාදනයෙන් ඇතිවන බලපෑම් .................................................. 8

7.2.1.4 විවෘත ස්ථාන වල මලද්‍රව්‍ය බැහැර කිරීම සහ ජලයෙන් රෝග අසාදනය වීම .................................................. 8

7.2.1.5 ජල මාර්ගයන්හි පහල ප්‍රදේශ වල ජල භාවිතය කෙරෙහි ඇතිවන බලපෑම් .................................................. 8

7.2.2 පාරිසරික බලපෑම් .................................................. 8

7.2.2.1 ශබ්දය සහ කම්පන මගින් ඇතිවිය හැකි බලපෑම් .................................................. 9

7.2.2.2 වායු දූෂණය හේතුවෙන් සිදුවන බලපෑම් .................................................. 9

7.2.2.3 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටළු .................................................. 9

7.2.2.4 පුපුරන ද්‍රව්‍ය සහ වෙනත් අන්තරායකාරක ද්‍රව්‍ය භාවිතය .................................................. 9

7.2.3 ජීව විද්‍යාත්මක/ පාරිසරික බලපෑම් .................................................. 9

7.2.3.1 වැදගත් වනජීවී වාසස්ථාන වලට ඇති විය හැකි බලපෑම් .................................................. 9

7.2.3.2 වෘක්ෂලතා සහ සතුන් මත ඇතිවන බලපෑම් .................................................. 9

7.2.4 සමාජීය සහ ආර්ථික බලපෑම් .................................................. 9

7.2.4.1 යෝජිත ප්‍රදේශයට ආසන්නතම කෘෂිකාර්මික කටයුතු කෙරෙහි ඇතිවන බලපෑම්....................9
7.2.4.2 කම්පනය නිසා රෝහල් ගොඩනැගිලි වල සිදුවන ඉරිතැලීම් ....................10
7.2.4.3 ජීවනෝපාය /ව්‍යාපාර සහ අදායම් මාර්ග කෙරෙහි ඇතිවන බලපෑම් ....................10
7.2.4.4 සේවා සැපයීම කෙරෙහි ඇතිවන බලපෑම් (ජල සැපයුම, මලාපවහන, විදුලිය)....................10
7.2.4.5 යටිතල පහසුකම් සහ ආරක්ෂාව සම්බන්ධයෙන් වන බලපෑම් ....................10
7.2.4.6 ඉදිකිරීම් අතරතුර ජනතාව ප්‍රදේශයට ඇතුළුවීමේ ඇති අවදානම....................10
7.2.4.7 සේවක නේවාසික කඳවුරු සහ අනෙකුත් ස්ථානීය අවශ්‍යතාවයන් ....................10
7.2.4.8 වැඩබිමේ සේවකයින් සහ ප්‍රදේශවාසීන් අතර ඇති සම්බන්ධතාවය සහ ඇති විය හැකි හැකි නොසන්සුන්තාවයන්....................11
7.2.4.9 ඉදිකිරීම් කාලය තුල සේවකයින්ගේ ආරක්ෂාව....................11
7.2.4.10 ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශය තුල පිහිටා ඇති ව්‍යාපාර, කෘෂිකාර්මික බිම් සහ අනෙකුත් ස්ථාන ....................11
7.2.4.11 ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශයට යාබදව පිහිටා ඇති ව්‍යාපාර, කෘෂිකාර්මික බිම් සහ අනෙකුත් ස්ථාන....................11
7.2.4.12 වැඩ බිමට පුද්ගලයින් ඇතුළු වීමේ හෝ ඒ හරහා ගමන් කිරීමේ අවශ්‍යතාව ....................11
8. සැලකිය යුතු පාරිසරික සහ සමාජීය බලපෑම් ....................11
8.1 මූලික සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටළු: කොන්ත්‍රාත්කරුවන් සඳහා සම්මත ගිවිසුම් අවශ්‍යතාවයන්ට අමතරව විශේෂිත සෞඛ්‍ය හා ආරක්ෂණ නිර්දේශයන්....................11
8.2 ළමා හා බලහත්කාර ශ්‍රමය....................12
9. පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව (ESMP) ....................12
9.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම....................12
9.2 තාවකාලික ඉවත් කිරීම ....................12
9.3 හානියට පත් ව්‍යුහයන් ඉවත් කිරීමේ ක්‍රියාපටිපාටිය, යටිතල පහසුකම් (හිමිකරුවන්ගේ ලිඛිත එකඟතාවය) ....................12
9.4 ව්‍යාපෘති හේතුවෙන් දේපල /භාවිතයන් අහිමි වීම සඳහා වන්දි ගෙවීම ....................12
9.5 මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබා දීම ....................12
9.6 සැලසුම් මත පදනම් වූ පාරිසරික /සමාජ කලමනාකරණ ක්‍රමවේදයන් සලකා බැලීම....................12
9.7 ඉදිකිරීම් අදියර තුල සිදුවන බලපෑම් අවම කිරීම ....................14
9.7.1 ඉදිකිරීම් අදියර තුල පාරිසරික හා සමාජයීය කළමනාකරණය සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ අනුකූලතාවය.....................14
9.7.2 ස්ථානීය විශේෂිත අවදානම අවමකරණය....................15
9.7.3 වැඩබිම සඳහා වන අධීක්ෂණ අවශ්‍යතා ....................17
10. මහජනතාවගේ සහ පාර්ශවකරුවන්ගේ අදහස් - පවත්වා ඇති සහ/හෝ පැවැත්වීමට අදහස් කරන 18
11. ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍යය අධිකාරිය විසින් නිකුත් කරන ලද කොවිඩ් - 19 වෛරසය වැළැක්වීමේ පියවර....................18
13. නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාව සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයතනයන්හි අනුමැතිය ලබා ගැනීම....................19
13.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම....................19
13.2 ව්‍යාපෘතියට අදාළ රජයේ/ ඉඩම් හිමියන්ගේ අනුමැතිය....................19
13.3 ඉඩම් හිමිකාරීත්වයෙන් කැමැත්ත/ විරුද්ධත්වයක් නොමැති බව/ නීත්‍යානුකූල ගිවිසුම ....................20
14. මෙම ව්‍යාපෘතිය සම්බන්ධ අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය....................20
15. ව්‍යාපෘති තොරතුරු නිකුත් කිරීම ....................21

ඇමුණුම 1: හඳුනාගත් ස්ථානයේ ස්වභාවය සහ උපදේශන ...... 22

## රූප සටහන් ලැයිස්තුව

රූපය 1: ආපදා අවම කිරීමේ ස්ථානයට ප්‍රවේශ මාර්ගය (පරිමාණයට නොවේ) ...... 2
රූපය 2: යෝජිත නායයාම් ආපදා අවම කිරීමේ ස්ථානයේ ගූගල් ඡායාරූපය ...... 3
රූපය 3: ආපදා අවදානම් අංගයන් සහ ප්‍රදේශයේ විශේෂිත ලක්ෂණ ...... 4
රූපය 4: යෝජිත ස්ථානයේ හරස්කඩ, භූමි පරිහරණය, අවදානම් අංග සහ අවකාශීය ලක්ෂණ ...... 5
රූපය 5: ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් අවදානමට ලක්විය හැකි සංරචකයන් ...... 7

## වගු සටහන් ලැයිස්තුව

වගුව 1: සිදුවිය හැකි අහිතකර බලපෑම් සහ ඒවායේ අවදානම් මට්ටම ...... 8
වගුව 2: සැලසුම් අදියරේදී පාරිසරික සහ සමාජීය සලකා බැලීම් ...... 12
වගුව 3: ES & HS කළමනාකරණයට අනුකූල වීම සඳහා “කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය” ...... 14
වගුව 4: ස්ථානීය විශේෂිත ES & HS අවමකරණ පියවරයන් ...... 15
වගුව 5: ඉදිකිරීම් අදියර සඳහා පාරිසරික හා සමාජයීය අධීක්ෂණ යාන්ත්‍රණය ...... 18
වගුව 6: නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාව සහ අනුමැතිය ...... 19
වගුව 7: අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත (තාවකාලික) කාලරාමුව ...... 20
වගුව 8: යෝජිත තොරතුරු බෙදා හැරීමේ යාන්ත්‍රණය ...... 21

# කෙටි යෙදුම්

| | |
|---|---|
| AIIB | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව<br>Asian Infrastructure Investment Bank |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය<br>Central Environmental Authority |
| CEB | ලංකා විදුලිබල මණ්ඩලය<br>Ceylon Electricity Board |
| DFC | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>Department of Forest Conservation |
| DS | ප්‍රාදේශීය ලේකම්<br>Divisional Secretary |
| DWLC | වන ජීවි සංරක්ෂණ දෙපාර්තුමේන්තුව<br>Department of Wild Life Conservation |
| EH & S | පරිසර හා සමාජ ආරක්ෂණ<br>Environmental Health & Social |
| E&SU of PMU | පාරිසරික සමාජ ආරක්ෂණ හා ව්‍යාපෘති කළමනාකරණ අංශය<br>Environmental & Social Unit of Project Management Unit |
| ESMF | පාරිසරික හා සමාජ කළමනාකරණ රාමුව<br>Environmental and Social Management Framework |
| ESMP | පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම<br>Environmental and Social Management Plan |
| GN | ග්‍රාම නිලධාරි<br>Grama Niladhari |
| GOSL | ශ්‍රී ලංකා රජය<br>Government of Sri Lanka |
| GSMB | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය<br>Geological Surveys & Mines Bureau |
| LHS | වම් පස<br>Left Hand Side |
| NBRO | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය<br>National Building Research Organization |
| RDA | මාර්ග සංවර්ධන අධිකාරිය<br>Road Development Authority |
| RHS | දකුණු පස<br>Right Hand Side |
| SSE & SMP | නිශ්චිත පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම<br>Site Specific Environmental and Social Management Plan |

## 1. හැදින්වීම

### 1.1 ව්‍යාපෘතිය පිලිබඳ විශ්ලේෂණය

ශ්‍රී ලංකා රජය ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) හා සම්බන්ධ වෙමින් එම බැංකුවේ මූල්‍ය අධාර මත ශ්‍රී ලංකාවේ පළාත් 06ක, දිස්ත්‍රික්ක 11ක නාය යෑම් සිදුවන ස්ථාන පිළිසකර කිරිමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය පාරිසරික හා සමාජ ආරක්ෂණමය වශයෙන් AIIB බැංකුවේ හා ලංකා රජයේ නීතිරීති වලට අනුකූලව සුදුවිය යුතුය. ව්‍යාපෘතියේ ස්වභාවය හා ක්‍රියාවලිය සැලකිල්ලට ගනිමින් AIIB බැංකුව අපේක්ෂා කරන පරිදි ඔවුන්ගේ පාරිසරික හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති වලට අනුකූලවන පරිදි පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුවක් (ESMF) සකසා ඇත.

පාරිසරික සහ සමාජීය කළමනාකරණ රාමුවෙහි (ESMF) අරමුණු වන්නේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී AIIB බැංකුවේ ආරක්ෂණ ක්‍රමවේදය සහ ජාතික පාරිසරික හා සමාජ ප්‍රඥප්තිය පිළිබඳ මාර්ගෝපදේශයන් සැපයීමයි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වශයෙන්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) සමස්ත ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කරනු ලබන පාරිසරික හා සමාජීය කළමනාකරණ රාමුව, ව්‍යාපෘතියට අදාළ පාර්ශවයන් ඒ අකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පාරිසරික, සමාජ, සෞඛ්‍ය හා ආරක්ෂණ තත්ත්වයන් ව්‍යාපෘති ස්ථානයෙන් ස්ථානයට වෙනස් වන බැවින් එවැනි වෙනස් වන නිශ්චිත තත්ත්වයන් පිලිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ.එම නිසා පාරිසරික සහ සමාජීය කළමනාකරණ රාමුවට අනුව පාරිසරික සහ සමාජීය ඇගයීම් සඳහා එක් එක් නායයාම් ස්ථානයට විශේෂිත වූ පාරිසරික හා සමාජ කළමනාකරණ වාර්තා (SSE & SMP) සකසා ඇත .එම ස්ථානයේ විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණය පිලිබඳ සැලසුම් මඟින් විශේෂිත පිළිසකර ක්‍රමවේදයන් ,සෞඛ්‍ය, සමාජ සහ ආරක්ෂණ කළමනාකරණය සම්බන්ධයෙන් සලකා බැලිය යුතු අංශයන් පිලිබඳ ,ඉදිකිරීම් සහ මෙහෙයුම් කාලය තුල අවශ්‍ය මග පෙන්වීම් ලබා දෙනු ඇත

මෙම විශේෂිත පාරිසරික හා සමාජීය කළමනාකරණ සැලසුම **දෙනියාය රෝහල් පරිශ්‍රයේ** නායයාම් අවම කිරිම සඳහා වේ. ගැඹුරු පාරිසරික හා සමාජීය අධ්‍යනයකින් පසුව මෙම සැලසුම සකස් කර ඇති අතර පහත කරුණු පිලිබඳ ඉහල අවධානයක් යොමු කර ඇත.

i. ව්‍යාපෘතියට අදාළ කලාපයේ සංවේදී පාරිසරික හා සමාජීය අංග හඳුනා ගැනීම .
ii. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සැලකිය යුතු පාරිසරික හා සමාජීය බලපෑම් හඳුනා ගැනීම
iii. හානිය අවම කරන පියවර යෝජනා කිරීම
iv. මෙම ව්‍යාපෘතියට අදාළ වන පාරිසරික සහ සමාජ නිරීක්ෂණ අවශ්‍යතා තීරණය කිරීම
v. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාලය තුලදී මෙම ව්‍යාපෘතියට අදාළ පාරිසරික නියමයන් හා ක්‍රියාපටිපාටීන් අධ්‍යනය කිරීම

### 1.2 අපේක්ෂිත පරිශීලකයින්

යෝජිත ව්‍යාපෘතිය සහ අවදානම් අවම කිරීමේ පියවරයන් හේතුවෙන් ඇතිවිය හැකි ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජීය කළමනාකරණ ගැටළු පිලිබඳ විස්තරයක් මෙම වාර්තාව තුලින් ඉදිරිපත් කරනු ලබයි. ව්‍යාපෘතිය යටතේ පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුවෙහි (ESMF) සංරචක ක්‍රියාත්මක කරනු ලබන පිරිසැලසුම් කණ්ඩායම (Design team), ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සහ කොන්ත්‍රාත්කරු මෙම සවිස්තරාත්මක ලේඛනය පරිශීලනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ තක්සේරු වාර්තා (SSE & SMP) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි (NBRO) වෙබ් අඩවියේ සහ AIIB වෙබ් අඩවියෙහි ප්‍රදර්ශනය කරන අතර මේ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන්ට (රාජ්‍ය හෝ වෙනත් පාර්ශවකරුවන්ට) ඒවා පරිශීලනය කිරීමට හැකියාව ලැබේ. එසේම, මෙමඟින් වැඩ ආරම්භ කිරීමට ප්‍රථමව කොන්ත්‍රාත්කරු විසින් සකස් කරනු ලබන පාරිසරික හා සමාජයීය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මේ කොටසක් වන ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම්වලට අවශ්‍ය පදනම නිර්මාණය කරනු ඇත.

## 2. ව්‍යාපෘතිය පිලිබඳ හැදින්වීම හා ආපදා ස්ථානීය තොරතුරු

### 2.1 ව්‍යාපෘතියේ නම

ආපදා අවම කිරීමේ ස්ථානීය අංක 104, දෙනියාය රොහල් පරිශ්‍රය, මාතර දිස්ත්‍රික්කය.

### 2.2 ස්ථානීය තොරතුරු

යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානය මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ඉහලගම ග්‍රාම නිළධාරී වසමේ දෙනියාය රෝහල් පරිශ්‍රය තුල පිහිටා ඇත.

**ස්ථානයේ GPS ඛණ්ඩාංක** – 6.357274°N සහ 80.569019°E

**උන්නතාංශය** – මුහුදු මට්ටමේ සිට උස අඩි 1378 (මීටර් 420)

**ආසන්නතම නගරය**– අවම කිරීමේ ස්ථානයේ සිට 3km පමණ දුරින් පිහිටි දෙනියාය නගරය ආසන්නතම වානිජ්‍යය හා පරිපාලන නගරය ලෙසින් හඳුනාගත හැක.

**ප්‍රවේශ මාර්ගය**

ආපදා අවම කිරීමේ ස්ථානය දෙනියාය රෝහල් පරිශ්‍රයේ පිහිටා ඇත. දෙනියාය නගරයේ සිට ගාල්ල - දෙනියාය - මාදම්පේ (A17) මාර්ගය හරහා කිලෝමීටර් 3 ක් පමණ ගිය විට, දෙනියාය රෝහල් පරිශ්‍රයෙන් අවම කිරීමේ ස්ථානයට පිවිසිය හැක. කොළඹ සිට එම ස්ථානයට ප්‍රවේශ මාර්ගය පහත පරිදි වේ.







*රූපය 1: ආපදා අවම කිරීමේ ස්ථානයට ප්‍රවේශ මාර්ගය (පරිමාණයට නොවේ)*

## 2.3 භූ ලක්ෂණ සහ භූමියේ අයිතිය

යෝජිත ආපදා අවම කිරීමේ ස්ථානය දෙනියාය රෝහල් පරිශ්‍රය තුළ පිහිටා ඇත. රෝහල පිහිටා ඇත්තේ කඳු මුදුනක වන අතර එම නිසා රෝහල් පරිශ්‍රය වටා දැඩි බෑවුමක් නිරීක්ෂණය කළ හැකිය. රෝහල් ගොඩනැගිලි සහ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩ ලබා ගැනීමට ස්වභාවික බෑවුම පියවරයන් වශයෙන් කපා වෙනස් කර ඇත. එම නිසා මීටර් 1.5 සිට 4 දක්වා වූ කණ්ඩි ඇතැම් ස්ථානයන්හි නිර්මාණය වී ඇත. පෙර අවස්ථාවන්හිදී සිදු වූ බෑවුම් අස්ථාවරවීම් හා කණ්ඩි කඩා වැටීම් ලක්ෂණ රෝහල් පරිශ්‍රයේ ස්ථාන කිහිපයක නිරීක්ෂණය විය.

මෙම ආපදා අවම කිරීමේ ස්ථානයේ භූමි ප්‍රමාණය වර්ග මීටර් 5000 ක් පමණ වේ. ඉඩම් අයිතිය සෞඛ්‍ය අමාත්‍යාංශය සතු වේ.




*රූපය 2: යෝජිත නායයාම් ආපදා අවම කිරීමේ ස්ථානයේ ගූගල් ඡායාරූපය*

### 2.4 ප්‍රදේශයේ කාලගුණ තොරතුරු

සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 3,000 සිට 3,500 දක්වා වේ. වැඩිම වර්ෂාපතනයක් ඔක්තෝබර්-නොවැම්බර් මාසවල ලැබෙන අතර අඩුම වර්ෂාපතනය ජනවාරි-පෙබරවාරි කාලය තුළ ලැබේ.

සාමාන්‍ය උෂ්ණත්වය 18°C සිට 31°C දක්වා වෙනස් වන අතර ඉහළ ආර්ද්‍රතා මට්ටම් පවතී

*(මූලාශ්‍රය: Weather atlas, https://www.weather-atlas.com/en/sri-lanka/deniyaya-climate)*

## 3. නායයාම් ආපදාව සම්බන්ධ තොරතුරු

### 3.1 නායයාම් ආපදාවේ ස්වභාවය

2003 මැයි මාසයේදී සිදු වූ නායයාමෙන් නිර්මාණය වූ නාය හිස ස්ථානයේ කුඩා ප්‍රමාණයේ බෑවුම් අස්ථාවර තත්ත්වයන් නිරීක්ෂණය කළ හැකි විය. ඒ හේතුවෙන් බාහිර රෝගී අංශයේ ආලින්දය ප්‍රදේශයට හානි සිදු වී ඇත. තවද, එම ප්‍රදේශය නාය හිස ආසන්නයේ පිහිටා ඇති බැවින් එය ගොඩනැගිල්ලේ ස්ථාවරත්වයටද බලපෑ හැකිය. බාහිර රෝගී අංශයේ ගොඩනැගිල්ලට දකුණු දෙසින් පිහිටි බෑවුම නාය යෑමේ අවදානම් කලාපයට අයත් වේ.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) මාතර දිස්ත්‍රික්කයේ නායයෑම් පර්යේෂණ හා අවදානම් අවම කිරීමේ අංශයේ දිස්ත්‍රික් කාර්යාලයට අනුව, 2013 වසරේ ඇති වූ අධික වර්ෂාව හේතුවෙන් රෝහලේ බාහිර රෝගී අංශය සඳහා ඇති ප්‍රවේශ මාර්ග ප්‍රදේශයේ ආතති පැළුම් පුළුල් වී ඇත. මෙම ආතති පැළුම් 2003 මැයි මාසයේදී සිදු වූ නායයාම නිසා නිර්මාණය වී ඇති අතර, එය ගොඩනැගිල්ලට යාබදව සහ ප්‍රවේශ මාර්ගය දිගේ මීටර් 20 ක් පමණ දුරක් බටහිර දිශාවට වර්ධනය වී ඇත. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම ආතති පැළුම් වැසෙන ලෙස තාර යොදා ඇත. ආතති පැළුම් දිගේ සුළු ගිලාබැසීමක් ද හඳුනාගත හැකිය. බාහිර රෝගී අංශයේ ආලින්දයේ පදික වේදිකාවේ ඉරිතැලීම් කිහිපයක් නිරීක්ෂණය කළ හැකි අතර ඒවා 2003 මැයි මාසයේදී සිදු වූ නාය යාමේ, නාය හිස ආසන්නයේ පිහිටා ඇත. මෙම පිපුරුම් ඔස්සේ ආලින්දය අඟල් 0.25 පමණ සිරස් විස්ථාපනය වීමකට (ගිලාබැසීම්) හා අඟල් 1ක් පමණ තිරස් විස්ථාපනය වීමකට (විවරවීම) භාජනය වී ඇත. තවද, ආලින්දයේ බිත්තියේ ඉහළ සිට පහළ දක්වා වූ ඉරිතැලීම් කිහිපයක් ද නිරීක්ෂණය කළ හැකිය. රෝහලේ ප්‍රවේශ මාර්ගයේ, කාර්යාල ගොඩනැගිලි ඉදිරිපිට ප්‍රදේශයේ දකුණු ඉවුර අවට අස්ථාවර භාවයක් පවතින අතර එම බෑවුමේ ද ආතති පැළුම් වර්ධනය වී සුළු ගිලාබැසීමක් ද සිදුවී ඇත. මෙම බෑවුම් ප්‍රදේශයට ඝන අපද්‍රව්‍ය බැහැර කර ඇති බව නිරීක්ෂණය විය. වාට්ටු අංක 5 ගොඩනැගිල්ලේ දකුණු කෙළවර කොටසේ බිමෙහි යම් යම් ඉරිතැලීම් නිරීක්ෂණය කළ හැකි විය. එම ඉරිතැලීම් බෑවුමට සමාන්තරව හා ස්පර්ශක ලෙස වර්ධනය වී ඇත. මෙම ගොඩනැගිල්ලට දකුණු දිශාවට මීටර් 4.5 ක දුරින් මීටර් 2.75 ක උසකින් යුත් කැපුම් බෑවුමක් ඇති අතර එහි සක්ක බැම්මක් ඉදිකර ඇත.




*රූපය 3: ආපදා අවදානම් අංගයන් සහ ප්‍රදේශයේ විශේෂිත ලක්ෂණ*

### 3.2 නායයාමෙන් සිදුවන බලපෑම හා එයින් ඇතිවන ප්‍රතිඵල

රෝහලට පිවිසෙන මාර්ගයෙහි වෙළඳසල අසලින් ඇති ඇළ මාර්ගය අවහිර වීම හේතුවෙන් එහි අස්ථාවර තත්ත්වයක් නිර්මාණය වී ඇත. එහෙයින්, රෝහලට පිවිසෙන එම මාර්ගය සම්පූර්ණයෙන් වසා දමා ඇත. තවද, 2020 දී කම්කරු කාමරය පිටුපස සහ වාට්ටු අංක 02 ගොඩනැගිල්ල අසල බැවුම් අස්ථාවර වී ඇත. එසේම, මෙම රෝහලේ බොහෝ ගොඩනැගිලිවල ඉරිතැලීම් මතුව ඇති අතර ඒ සියල්ල අවදානම් තත්ත්වයෙන් සේවා කටයුතු සිදු කරගෙන යයි.

### 3.3 පවතින අවදානම අවම කිරීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග

සිදුවිය හැකි ආපදා අවදානම අවම කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. එහෙත්, NBRO නිලධාරීන් විසින් නිකුත් කරන ලද නායයෑම් විමර්ශන වාර්තාවල පහත සඳහන් ආපදා අවම කිරීමේ ක්‍රියාමාර්ගයන් නිර්දේශ කර ඇත.

i. බාහිර රෝගී අංශයේ ගොඩනැගිල්ලට දකුණු දෙසින් පිහිටි බෑවුමට වැසි ජලය ගලා යාම අවම කළ යුතුය.
ii. බෑවුම් ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම නොකළ යුතුය.
iii. බෑවුමට ආසන්න ප්‍රදේශයෙහි ඉදිකිරීම් කටයුතු සිදු නොකළ යුතුය.
iv. නව ඉදිකිරීම් හේතුවෙන් නිර්මාණය වී ඇති කණ්ඩි සඳහා සිවිල් ඉංජිනේරු අධීක්ෂණය යටතේ රැඳවුම් බැම් ඉදිකළ යුතුය.
v. 2003 මැයි මාසයේදී සිදු වූ නායයාම හේතුවෙන් නිර්මණය වී ඇති නාය හිස පාංශු ඇණ යොදා (Soil nailing) ස්ථාවර කළ යුතුය.
vi. 2003 මැයි මාසයේදී නායයාම සිදු වූ ස්ථානයේ දකුණු ඉවුර හා මෑතකදී සංවර්ධනය කරන ලද කලාපය අතර ප්‍රදේශය ආධාරක කුළුණු මගින් ස්ථාවර කළ යුතුය.
vii. පාංශු ඇණ මගින් ස්ථාවර කළ නොහැකිනම්, බාහිර රෝගී අංශයේ ගොඩනැගිල්ලේ ආලින්දය ප්‍රදේශය කඩා ගොඩනැගිල්ලේ ප්‍රධාන ව්‍යුහයෙන් ඉවත් කළ යුතුය.

### 3.4 තාවකාලික ඉවත් කිරීම්

මෙම ස්ථානය සඳහා ව්‍යාපෘතිය පදනම් කරගත් තාවකාලික ඉවත් කිරීමේ වැඩසටහනක් අවශ්‍ය නොවේ.

### 3.5 නැවත පදිංචි කිරීම (ප්‍රගතිය)

මෙම ස්ථානය සඳහා ව්‍යාපෘතිය පදනම් කරගත් නැවත පදිංචි කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.




*රූපය 4: යෝජිත ස්ථානයේ හරස්කඩ, භූමි පරිහරණය, අවදානම් අංග සහ අවකාශීය ලක්ෂණ*

## 4. නායයෑම්/ භූ අස්ථාවර වූ ප්‍රදේශය, අවට ප්‍රදේශය පිළිබඳ විස්තර සහ වර්තමාන අවදානම් මට්ටම

### 4.1 භූමි අස්ථාවරත්වය සිදුව ඇති ප්‍රදේශය අවට තොරතුරු

මෙම ආපදා අවම කිරීමේ ස්ථානය දෙනියාය රෝහල් පරිශ්‍රයේ පිහිටා ඇත. රෝහලට වසර 100කට වැඩි ඉතිහාසයක් ඇත. රෝහල් වාට්ටු, පරිපාලන ගොඩනැගිලි, කාර්ය මණ්ඩල නිල නිවාස සහ සිල්ලර වෙළඳසැල් ඇතුළු ගොඩනැගිලි 20 ක් පමණ රෝහල් පරිශ්‍රයේ පිහිටා ඇත. බ්‍රිතාන්‍ය පාලන සමයේදී ඉදිකළ රෝහලේ ගොඩනැගිලි කිහිපයක්ද පවතී. මෙම රෝහලේ දැඩි සත්කාර ඒකකයක් සහ මාතෘ වාට්ටුවක් ඇතුළු වාට්ටු 09ක් පමණ ඇත. සාමාන්‍යයෙන් මසකට රෝගීන් 5,000ක් බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ලබති. රෝහලේ ඇඳන් 144 ක් ඇති අතර දිනකට ඇඳන් 80% කට වඩා වැඩි පිරිසක් රෝගීන් වෙනුවෙන් භාවිත වේ. වෛද්‍යවරුන්, හෙදියන්, සුළු කාර්ය මණ්ඩලය සහ පරිපාලන කාර්ය මණ්ඩලය ඇතුළුව රෝහලේ මුළු කාර්ය මණ්ඩලය 223 කි.

සියලුම රෝහල් ගොඩනැගිලි සහ එහි අනෙකුත් දේපල කඳු මුදුනක පිහිටා ඇති අතර අවට ඇති බෑවුම් ප්‍රදේශ පඳුරු හා ගස් විශේෂ වලින් සමන්විත වේ. බෑවුම පහළ ප්‍රදේශය මධ්‍යයේ තැනින් තැන ජනාවාස, තේ වගා ප්‍රදේශ සහ වී වගා කරන ප්‍රදේශවලින් ආවරණය වී ඇත. ගාල්ල - දෙනියාය - මාදම්පේ (A17) මාර්ගය ස්ථානයේ බටහිර දෙසින් දිවෙන අතර දෙනියාය රෝහලට ළඟා වීමට ප්‍රධාන මාර්ගයේ සිට පටු ප්‍රවේශ මාර්ග දෙකක් ඇත. නිරීක්ෂණ අවස්ථාවේ, මාර්ගයේ අස්ථාවර තත්ත්වය හේතුවෙන් එක් පිවිසුම් මාර්ගයක් ස්ථිරව වසා තිබිණි.

### 4.2 වර්තමාන අවදානම් ස්වාභාවය

අනාගතයේදී සිදුවිය හැකි නායයෑම් සහ බෑවුම් අස්ථාවරවීම් වළක්වා ගැනීම සඳහා පියවර නොගතහොත්, එය පැරණි රෝහල් ගොඩනැගිලි, පරිපාලන ගොඩනැගිලි, පහළ බෑවුමේ පදිංචිකරුවන් සහ රෝහලට ප්‍රවේශ වන මාර්ගයට සෘජුවම බලපානු ඇත. මෙය මාතෘ වාට්ටුවක් සහ දැඩි සත්කාර ඒකකයක් සහිත මූලික රෝහලක් බැවින් පුළුල් පරාසයක ජනතාව මෙම රෝහලෙන් සේවාවන් ලබා ගනී. එහෙයින්, ආපදා අවදානම අවම කිරීම සඳහා ඉක්මන් ක්‍රියාමාර්ග නොගතහොත් වැසි සමයේදී ඔවුන් පීඩාවට පත් වනු ඇත.

## 5. යෝජිත පිළිසකර කිරීමේ ක්‍රියා මාර්ගයන්

යෝජිත ව්‍යාපෘතිය බෑවුම්වල තවදුරටත් සිදුවිය හැකි අස්ථාවරත්වයන් වැළැක්වීම සහතික කිරීම අරමුණු කර ගෙන ඇත. යෝජිත අවම කිරීමේ කටයුතු බොහෝ දුරට OPD ගොඩනැගිල්ල අසල අස්ථායී ප්‍රදේශය සහ අස්ථායී මාර්ග ප්‍රදේශය කෙරෙහි අවධානය යොමු කරනු ඇත. එබැවින්, ආපදා අවම කිරීමේ පියවරයන් ලෙස බැමි ඉදි කිරීම්, ප්‍රධාන නාය හිස පාංශු ඇණ මගින් ස්ථාවර කිරීම, මතුපිට හා අභ්‍යන්තර ජලාපවහනය කළමනාකරණය සහ බෝක්කු ඉදිකිරීම වැනි ආපදා අවම කිරීමේ පියවරයන් ක්‍රියාත්මක කෙරේ.

## 6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්වන අවට පරිසරයේ සංවේදී ඒකක පිළිබඳ කෙටි හැඳින්වීම

ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් පහත සංවේදී සංරචකයන් අවදානමට ලක් වනු ඇත;

i. දෙනියාය රෝහලේ පැරණි සහ නව ගොඩනැගිලි
ii. රෝහලේ කාර්ය මණ්ඩලය
iii. බාහිර රෝගී අංශයේ සහ නේවාසික රෝගීන්
iv. ගිලන් රථ ගාල් කිරීම ඇතුළු වාහන නැවැත්වීමේ ස්ථාන
v. රෝහලේ සේවා කටයුතු

යොමුව - රූපය 5: ව්‍යාපෘති ක්‍රියාවන් මගින් බලපෑමට ලක්විය හැකි සංවේදී සංරචකයන්.

| | |
|---|---|
|  |  |
| *රූපය 5a: රෝහල් ගොඩනැගිලි* | *රූපය 5b: ගිලන් රථ ගාල* |
|  |  |
| *රූපය 5c: ප්‍රවේශ මාර්ගය* | *රූපය 5d: නිල නිවාස* |

*රූපය 5: ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් අවදානමට ලක්විය හැකි සංරචකයන්*

## 7. ව්‍යාපෘති ප්‍රදේශය හා සම්බන්ධ සමාජ, පාරිසරික බලපෑම් සහ අවදානම් හඳුනා ගැනීම

### 7.1 හිතකර බලපෑම්

- දැනට අවදානමට ලක්ව ඇති රෝහල් පරිශ්‍රයේ ගොඩනැගිලි ආරක්ෂිත වන අතර, රෝහලේ අස්ථායී ප්‍රදේශ අනාගතයේදී සිදුවිය හැකි බෑවුම් අස්ථාවරවීම් වලින් ආරක්ෂා වනු ඇත.

- යෝජිත ව්‍යුහාත්මක ක්‍රමවේද මගින් ආපදා අවම කිරීමෙන් රෝගීන්ගේ, රෝහල් කාර්ය මණ්ඩලයේ, ගොඩනැගිලිවල සහ එහි දේපළවල ආරක්ෂාව සැලකිය යුතු ලෙස ඉහළ නංවනු ඇත.

- අනාගත බෑවුම් අස්ථාවරවීම් නොමැති හෙයින්, බාධාවකින් තොරව රෝහලේ සෞඛ්‍ය සේවාවන්හි ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීමට හැකිවීම.

- මාතෘ හා ශල්‍යාගාර පහසුකම් සහිත ප්‍රදේශයේ ඇති එකම ප්‍රධාන රෝහල මෙයයි. එබැවින්, මෙම ප්‍රදේශයේ සෞඛ්‍ය පහසුකම් ලබා ගන්නා ජනතාවට ආපදා අවම කිරීමේ ක්‍රියාමාර්ගයන් මගින් බොහෝ දුරට ප්‍රතිලාභ ලබා දෙනු ඇත.

- රෝගීන්ට, වෛද්‍යවරුන්ට සහ කාර්ය මණ්ඩලයට නායයෑම් පිළිබඳ කිසිදු බියකින් තොරව වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමට සහ ලබා ගැනීමට හැකිය. මෙය ඔවුන් මානසික ස්ථාවරත්වයට සහ ධනාත්මක සෞඛ්‍ය සේවා පරිසරයක් කරා ගෙන යනු ඇත.

- කෙටි කාලීන ආපදා අවම කිරීමේ අවශ්‍යතාවයන් මතු නොවන හෙයින්, එය මෙම ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියෙහි ප්‍රධාන ආර්ථික ප්‍රතිලාභවලින් එකකි.

### 7.2 අහිතකර බලපෑම්

මෙම අවදානම් අවම කිරීමේ ක්‍රියාකාරකම් බෙහෙවින්ම අවදානම් , අස්ථාවර භූමි ප්‍රදේශයට පමණක් සීමා වනු ඇති අතර ඉදිකිරිම සිදුවන කාල සීමාවට පමණක් වලංගු වේ .

වගුව 1: සිදුවිය හැකි අහිතකර බලපෑම් සහ ඒවායේ අවදානම් මට්ටම

| ඉදිකිරීම් කාල සීමාව තුලදී සිදුවන බලපෑම් | අවදානම් මට්ටම |
|---|---|
| **7.2.1 ජල විද්‍යාත්මක බලපෑම්** | |
| **7.2.1.1 ප්‍රදේශයේ ජලාපවහන රටාවට සිදුවිය හැකි බලපෑම්**<br>අස්ථායී බෑවුම් නැවත සකස් කිරීම, පස් ඉවත් කිරීම සහ පවතින ජලාපවහන කාණු සහ මතුපිට ජලය ගලා බසින මාර්ග වෙනස් කිරීම හේතුවෙන් ප්‍රදේශයේ පවතින මතුපිට සහ උප මතුපිට ජලාපවහන රටාවට බාධා ඇතිවීම අපේක්ෂා කළ හැක. මෙම ස්ථානයේ ආපදා අවම කිරීමේ කටයුතු බොහෝ දුරට ජලාපවහන රටාව වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. ජල මාර්ග වෙනස් කිරීම් වැනි ක්‍රියාකාරකම් හේතුවෙන්, වර්ෂා කාලවලදී පරිශ්‍රය තුල වැඩි ප්‍රවේගයකින් ජලය ගලායාම සිදු වේ. එසේම, ඉදිකිරීම් අතරතුර සිදුකරන කැණීම් සහ බිම් එළිපෙහෙළි කිරීම් වැනි කටයුතු මගින් වැසි දිනවල බෑවුමේ පහළට මඩ සමඟ මතුපිට ජලය අඛණ්ඩව ගලා යාම සිදු වේ. මෙය බෑවුමේ පහළ ප්‍රදේශයන්හි ජීවත්වන පදිංචිකරුවන්ට සහ ඔවුන්ගේ වගාවන්ට අහිතකර ලෙස බලපානු ඇත. | වැදගත් |
| **7.2.1.2 ජල දූෂණය මගින් සිදුවිය හැකි බලපෑම්**<br>රෝහල් පරිශ්‍රයට ආසන්නව බෑවුමට සමාන්තරව ඇළ මාර්ගයක් නිරීක්ෂණය විය. මෙම ඇළ මාර්ගය ආසන්නයේ ඇති ප්‍රවේශ මාර්ගය එක් ආපදා අවම කිරිමේ ස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත.<br>එහෙයින්, ඉදිකිරීම් හේතුවෙන් වැසි සමයේදී අවසාදිත හා පාංශු අංශු හේතුවෙන් මෙහි ජලය අපවිත්‍ර විය හැකිය. කැණීමේදී හා සුන්බුන් ඉවත් කිරීමේදී අධික අවසාදිත ගලා යාමක් අපේක්ෂා කළ හැකි අතර දූෂිත අපද්‍රව්‍ය මෙම ජල ප්‍රවාහයට ඇතුළු වී ජලය දූෂණය වීමට ඉඩ ඇත. එවිට එම ජලයේ පානය ,ස්නානය සහ ජලජීවි වගාව සඳහා තිබිය යුතු අවම ගුණාත්මක භාවය ඉක්මවා යාම නිසා එමගින් ජලයේ ගුණාත්මකභාවයට සැලකිය යුතු බලපෑමක් සිදු කල හැක. | වැදගත් |
| **7.2.1.3 බාදනයෙන් ඇතිවන බලපෑම්**<br>වර්ෂා කාලවලදී අධික ජල ප්‍රවාහයක් ජනනය වීමේ හැකියාවක් පවතී. එමගින්, ආපදා අවම කිරීමේ එක් ස්ථානයක් වන ඇළ මාර්ගයට සෘජුවම හෝ කාණු හරහා ඛාදන අංශු ඇතුළුවීම අපේක්ෂා කළ හැකිය. මෙමගින් ඇළ ඉවුරු ඛාදනය වීම හා ඇළ මාර්ගයට අධික ඛාදන අංශු එකතුවීම සිදු විය හැකිය. | වැදගත් |
| **7.2.1.4 විවෘත ස්ථාන වල මලද්‍රව්‍ය බැහැර කිරීම සහ ජලයෙන් රෝග අසාදනය වීම**<br>මෙම ස්ථානය රෝහල් පරිශ්‍රයක් තුළ පිහිටා ඇති බැවින් විවෘත මළපහ කිරීමට ඇති ඉඩකඩ අඩුය. | නොවැදගත් |
| **7.2.1.5 ජල මාර්ගයන්හි පහල ප්‍රදේශ වල ජල භාවිතය කෙරෙහි ඇතිවන බලපෑම්**<br>පහළ බෑවුම් ප්‍රදේශයේ ඇති සමහර නිවාස තම කටයුතු සඳහා ජලය ලබාගන්නේ මෙම ඇළ මාර්ගයෙනි. විශේෂයෙන්ම වැසි සමයේදී ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ඇළ මාර්ගය සහ ජල උල්පත්වල ජලය අපවිත්‍ර වීමේ හැකියාව ඉතා ඉහළ ය. මෙය පහළ බෑවුම් ප්‍රදේශයේ මෙම මූලාශ්‍රයන්ගෙන් ජලය භාවිතා කරන්නන්ගේ පානිය ජල අවශ්‍යතාවය, සේදුම් කටයුතු සහ ස්නානය කිරීමේ අවශ්‍යතා වලට බලපානු ඇත. | වැදගත් |
| **7.2.2 පාරිසරික බලපෑම්** | |

| | |
|---|---|
| **7.2.2.1 ශබ්දය සහ කම්පන මඟින් ඇතිවිය හැකි බලපෑම්**<br>මෙම ස්ථානයේ භූමිය සැකසීමේදී සහ භූමි අලංකරණයේදී යන්ත්‍රෝපකරණවලින් අධික ශබ්දය අපේක්ෂා කළ හැක. රෝහල් සංකීර්ණය ආසන්නයේ ඉදිකිරීම් කටයුතු සිදුකෙරෙන බැවින් මෙම බලපෑම කැපී පෙනේ. යන්ත්‍ර සූත්‍රවලින් ජනනය වන ශබ්දය සෞඛ්‍ය සේවාවන්හි සුමට ක්‍රියාකාරිත්වයට බාධාවක් වන අතර රෝගීන්ටද අහිතකර ලෙස බලපානු ඇත. එබැවින් මෙම ස්ථානයේ ශබ්දයේ බලපෑම් ඉතා වැදගත් ලෙස සැලකේ.<br><br>බොහෝ රෝහල් ගොඩනැගිලි සහ නිල නිවාස ඉදිකර ඇත්තේ බ්‍රිතාන්‍ය පාලන සමයේදී වන අතර එබැවින් මෙම ගොඩනැගිලිවල ඉදිකිරීම් වයස අවුරුදු 100 ඉක්මවයි. ඇතැම් ගොඩනැගිලිවල ඉරිතැලීම් ද මතුව ඇත. බර යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමේදී එයින් ඇතිවන කම්පනය එම ගොඩනැගිලිවලට අහිතකර බලපෑම් කළ හැකිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, නව ඉරිතැලීම් ඇති කිරීම, පවතින ඉරිතැලීම් පුළුල් කිරීම සහ බිත්ති කඩා වැටීම වැනි ව්‍යුහාත්මක අස්ථාවර වීම් සිදුවිය හැකිය. එබැවින් මෙම ස්ථානයේ කම්පන බලපෑම් ද ඉතා වැදගත් ලෙස සැලකේ. | **ඉතා වැදගත්** |
| **7.2.2.2 වායු දූෂණය හේතුවෙන් සිදුවන බලපෑම්**<br>වාහන ගමනාගමනය, භූමිය එළි පෙහෙළි කිරීම, වැලි, සිමෙන්ති වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම සහ හැසිරවීම හේතුවෙන් ඉදිකිරීම් භූමියේ සහ ඒ අවට ජනනය වන දූවිලි හා පිටාර වායු හේතුවෙන් වාතයේ ගුණාත්මක භාවයට බලපෑම් ඇතිවිය හැක.<br><br>බාහිර රෝගී අංශය සහ අනෙකුත් රෝහල් ගොඩනැගිලි ආපදා අවම කිරීමේ ස්ථාන ආසන්නයේ පිහිටා ඇති බැවින්, වායු දූෂණ බලපෑම් සහ දූවිලි අංශු පිළිබඳ සැලකිය යුතු ය. වායු දූෂණ බලපෑමට බෙහෙවින් ගොදුරු විය හැකි රෝගීන්, වැඩිහිටියන් සහ විශේෂයෙන්ම ගැබිනි මව්වරුන් සහ ළදරුවන්ට මෙම බලපෑම ඉතා අහිතකර වේ. | **ඉතා වැදගත්** |
| **7.2.2.3 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටළු**<br>ඉදිකිරීම් කාලය අතරතුර ඝන අපද්‍රව්‍ය දෙආකාරයකට ජනනය විය හැක. එනම් ඉදිකිරීම් ක්‍රියාකාරකම් නිසා ජනනය වන අපද්‍රව්‍ය සහ ඉදිකිරීම් වල නිරතව සිටින සේවකයින් විසින් ජනනය කරනු ලබන ගෘහස්ථ අපද්‍රව්‍යයයි.<br><br>ඉදිකිරීම් අදියරේදී කසළ, ආහාර අපද්‍රව්‍ය සහ ඉදිකිරීම් අපද්‍රව්‍ය වැනි ඝන අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය නොකිරීම නිසා රෝගීන්ට සහ රෝහල් කාර්ය මණ්ඩලයට අපහසුතා ඇති විය හැක. තවද, එමගින් අසල ඇති කාණු පද්ධතිය අවහිර කල හැකි අතර, එය ජලයෙන් සම්ප්‍රේෂණය වන වාහකයන් සහ රෝග කාරක උවදුර සඳහා අභිජනන ස්ථානක් බවට පත් වේ. එසේම, අපද්‍රව්‍ය මගින් පස දූෂණය විය හැකි අතර ඉදිකිරීම් කාලය තුළ නිසි බැහැර කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවන්නේ නම් විවිධ පාරිසරික බලපෑම් ඇති කළ හැකිය. ආපදා අවම කිරීමේ ස්ථානය රෝහල් පරිශ්‍රයක් තුළ පිහිටා ඇති නිසාත්, රෝගීන් ඒ සඳහා ගොදුරු වීමේ වැඩි අවදානමක් පවතින නිසාත්, මෙම ස්ථානයේ ඝන අපද්‍රව්‍ය දුර්වල ලෙස කළමනාකරණය කිරීමේ පාරිසරික හා සෞඛ්‍ය බලපෑම් ඉතා වැදගත් වනු ඇත. | **ඉතා වැදගත්** |
| **7.2.2.4 පුපුරන ද්‍රව්‍ය සහ වෙනත් අන්තරායකාරක ද්‍රව්‍ය භාවිතය**<br>බලපෑමට ලක්වූ බෑවුමෙහි විශාල පාෂාණ නොමැත. එබැවින් පාෂාණ පිපිරීමක් සිදුවීමට ඉඩක් නොමැත. | නොවැදගත් |
| **7.2.3 ජීව විද්‍යාත්මක/ පාරිසරික බලපෑම්** | |
| **7.2.3.1 වැදගත් වනජීවී වාසස්ථාන වලට ඇති විය හැකි බලපෑම්**<br>මෙම ව්‍යාපෘති ප්‍රදේශය තුල ඉහල ජෛව විවිධත්වයක් ඇති හෝ වාසස්ථාන ඛණ්ඩනය වීමක් හෝ වන ජීවී කලාපයක් නොමැත . | නොවැදගත් |
| **7.2.3.2 වෘක්ෂලතා සහ සතුන් මත ඇතිවන බලපෑම්**<br>මෙම ප්‍රදේශයෙන් හමුවන බොහෝ ශාක වර්ග IUCN රතු දත්ත පොතට ඇතුලත් වී නොමැති අතර ආවේනික හෝ තර්ජනයට ලක්වූ යන බලපෑම් වලින් මුක්ත ප්‍රදේශයකි. | නොවැදගත් |
| **7.2.4 සමාජීය සහ ආර්ථික බලපෑම්** | |
| **7.2.4.1 යෝජිත ප්‍රදේශයට ආසන්නතම කෘෂිකාර්මික කටයුතු කෙරෙහි ඇතිවන බලපෑම්**<br>යෝජිත ප්‍රදේශයේ හෝ ආසන්නයේ කිසිදු කෘෂි කාර්මික කටයුත්තක් සිදු නොවේ | නොවැදගත් |

| | |
|---|---|
| **7.2.4.2 කම්පනය නිසා රෝහල් ගොඩනැගිලි වල සිදුවන ඉරිතැලීම්**<br>බ්‍රිතාන්‍ය යුගයේ ඉදිකරන ලද ගොඩනැගිලි කිහිපයක් ආපදා අවම කිරීමේ භූමියට ආසන්නයේ පිහිටා ඇත. මෙම ස්ථානය ආසන්නයේ ඇතැම් ගොඩනැගිලිවල ද ඉරිතැලීම් ද ඇති වී තිබේ.<br><br>ඉදිකිරීම් අතරතුර බර යන්ත්‍ර සූත්‍ර භාවිතා කරන අතර කම්පනය හේතුවෙන් මෙම ගොඩනැගිලිවල නව ඉරිතැලීම් ඇති විය හැකි අතර එය බෑවුමට ආසන්න ගොඩනැගිලිවල ස්ථායීතාවයටද බලපායි. | ඉතා වැදගත් |
| **7.2.4.3 ජීවනෝපාය /ව්‍යාපාර සහ අදායම් මාර්ග කෙරෙහි ඇතිවන බලපෑම්**<br>මෙම ප්‍රදේශයට ආසන්නව කුඩා සිල්ලර වෙළඳසැල් දෙකක් ඇති අතර එමගින් රෝහලට පැමිණෙන පුද්ගලයින්ට ආහාර සහ මූලික අවශ්‍යතා සපයයි. ඉදි කිරීමේදී මෙම වෙලදසල් වල ව්‍යාපාරික කටයුතු වලට බාධා ඇති විය හැක. කෙසේ වෙතත්, මෙම වෙළඳසැල් කෙරෙහි ධනාත්මක බලපෑමක්ද ඇති වනු ඇත. එනම්, ශ්‍රම බලකාය මෙම වෙලදසල් මඟින් ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපයාගනු ඇත. | වැදගත් |
| **7.2.4.4 සේවා සැපයීම කෙරෙහි ඇතිවන බලපෑම් (ජල සැපයුම, මලාපවහන, විදුලිය)**<br>ඉදිකිරීම් කටයුතු වලදී සහ යන්ත්‍රෝපකරණ ගෙන යාමේදී ආපදා අවම කිරීමේ ස්ථානය හරහා ගමන් කරන ජල සැපයුම් මාර්ගයට හානි සිදු වේ. | වැදගත් |
| **7.2.4.5 යටිතල පහසුකම් සහ ආරක්ෂාව සම්බන්ධයෙන් වන බලපෑම්**<br>ඉදිකිරීම් අදියරේදී අවම කිරීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් රෝහලේ එක් ප්‍රවේශ මාර්ගයක් අවහිර වනු ඇත. තවද, නිතර ගමන් කරන වාහන, යන්ත්‍රෝපකරණ, ට්‍රක් රථ සහ ලෝඩර් රථ හේතුවෙන් රොහලේ රථගාලට සහ බාහිර රෝගී අංශයේ ගොඩනැගිල්ලට බාධා එල්ල විය හැකිය. එබැවින් යටිතල පහසුකම් සහ ආරක්ෂාව අහිමි වීම හේතුවෙන් ඇතිවන බලපෑම ස්ථානීය වශයෙන් වැදගත් වේ. | වැදගත් |
| **7.2.4.6 ඉදිකිරීම් අතරතුර ජනතාව ප්‍රදේශයට ඇතුළුවීමේ ඇති අවදානම**<br>ඉදිකිරීම් අදියරේදී භූමියේ කැණීම් යන්ත්‍රෝපකරණ, ලෝඩර්, ට්‍රක් රථ ආදිය භාවිතා කළ හැක. මෙම යන්ත්‍ර සහ බර වාහන ආදිය රෝගීන් සහ රෝහල් කාර්ය මණ්ඩලය ගමන් කරන රෝහල් පරිශ්‍රයේ භාවිතා කරනු ඇත. ඇතැම් යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ස්ථානයේ අධි වෝල්ටීය විදුලි බලය භාවිතා කළ හැක. එසේම, ඉදිකිරිමේදී භාවිත කරන ලෝහ, වානේ වැනි ද්‍රව්‍ය නුසුදුසු ගබඩා කිරීම සහ හැසිරවීම යටතේ හානිකර විය හැකිය.<br><br>එහෙයින්, අපදා අවම කිරීමේ ස්ථානයට ඇතුළුවීම පිළිබඳ නොදැනුවත්කම සහ යන්ත්‍රෝපකරණ නොසැලකිලිමත් ලෙස ක්‍රියාත්මක කිරීම අවට සිටින පුද්ගලයින්ට මාරාන්තික තුවාල හා අනතුරු ඇති කළ හැකිය. | ඉතා වැදගත් |
| **7.2.4.7 සේවක නේවාසික කඳවුරු සහ අනෙකුත් ස්ථානීය අවශ්‍යතාවයන්**<br>සේවක කඳවුරු ඉදිකිරීම් භූමියට ආසන්නව හෝ රෝහල් පරිශ්‍රය තුළ ස්ථාපිත කෙරේ. එය ආපදා අවම කිරීමේ ස්ථානයට සමීපව තෝරා ගන්නේ නම්, අසල්වැසි ප්‍රදේශයෙන් තෝරා ගනු ලැබේ. නිසි කඳවුරු කළමනාකරණයක් ක්‍රියාත්මක නොවන්නේ නම්, කම්කරු ප්‍රශ්න, ප්‍රජාව සමඟ සමාජ ගැටලු, පොදු සම්පත් බෙදා ගැනීමේදී ඇතිවන ගැටුම්, සහ අපද්‍රව්‍ය කළමනාකරණය යනාදි ගැටළු ඇති විය හැකිය. තාවකාලික කඳවුරු, ඉදිකිරීම් භූමියට ආසන්නයේ ඉදිකරන්නේ නම්, ඝන අපද්‍රව්‍ය හා අපද්‍රව්‍ය කළමනාකරණය ගැටළුවක් වනු ඇත. එබැවින් එයින් ඇතිවන බලපෑම් සැලකිය යුතු ය. | වැදගත් |

| | |
|---|---|
| **7.2.4.8 වැඩබිමේ සේවකයින් සහ ප්‍රදේශවාසීන් අතර ඇති සම්බන්ධතාවය සහ ඇති විය හැකි හැකි නොසන්සුන්තාවයන්**<br>ආපදා අවම කිරීමේ ස්ථානය රෝහල් පරිශ්‍රයක් තුළ පිහිටා ඇත. මෙම වැඩබිමෙහි ඉදිකිරීම් කටයුතු සිදු කරන කම්කරුවන් විවිධ සමාජ පසුබිම්වලින් සහ විවිධ භූගෝලීය ප්‍රදේශවලින්, හෝ බොහෝ විට දරිද්‍රතාවයෙන් පෙළෙන අය වේ. සාමාන්‍යයෙන් ඔවුන් අවම අධ්‍යාපනික සහ සමාජ පසුබිමක් ඇති අයයි. එහෙයින්, ඔවුන් රෝහලේ රෝගීන්ට, වෛද්‍යවරුන්ට සහ අනෙකුත් කාර්ය මණ්ඩලයට ආතතිය ඇති කිරීමට හැකි සැලකිය යුතු බලපෑමක් එල්ල කළ හැකිය. එය පහත පරිදි ඉදිරිපත් කළ හැක.<br>• රෝහල් කටයුතු සුමටව කරගෙන යාමට බාධා ඇති කරයි.<br>• රෝහල් පරිශ්‍රයේ සීමා සහිත ප්‍රදේශවලට අනවසරයෙන් ඇතුළුවීම.<br>• රෝගීන්ට හිරිහැර සිදුවීම.<br>• රෝහල් කාර්ය මණ්ඩලය සහ රෝගීන් සමඟ ආරවුල් ඇතිකර ගැනීම.<br>• කාර්ය මණ්ඩලය සහ ප්‍රජාව අහිතකර ගනුදෙනු සඳහා පෙළඹවීම.<br>• අවිධිමත් ලෙස ළමා ශ්‍රමය යොදා ගැනීම.<br>• ශ්‍රම බලකාය විසින් රෝහලේ සනීපාරක්ෂක පහසුකම් භාවිතා කිරීම.<br>• පොදු සම්පත් සඳහා අසල්වැසි ප්‍රජාව සමග ගැටුම් ඇතිකර ගැනීම.<br><br>සේවකයින් මෙවැනි ක්‍රියාකාරකම් කෙරෙහි නැඹුරු වීම ඉතා කලාතුරකින් ඇතිවිය හැකි තත්වයක් වුවත් මෙවැනි තත්ත්ව ඇතිවීමට ඇති ඉඩකඩ නොසලකා හැරිය නොහැක. එබැවින් මෙහි දක්වා ඇති සමාජීය ගැටළු ඉතා වැදගත් ලෙස සලකනු ලැබේ. | ඉතා වැදගත් |
| **7.2.4.9 ඉදිකිරීම් කාලය තුල සේවකයින්ගේ ආරක්ෂාව**<br>කම්කරුවන් ඉදිකිරීම් කටයුතු වලදී බෑවුම් වලින් ඇදවැටීමේ අවදානමට ලක් විය හැකි අතර බෑවුම් කඩා වැටීම් හේතුවෙන් මාරාන්තික තුවාල ඇති විය හැක .තවද බර යන්ත්‍රෝපකරණ ඉතා කුඩා අවකාශයක හැසිරවීම් සිදු කෙරෙන නිසා මෙමඟින් ඇති විය හැකි අවදානම පිළිබඳ සලකා බැලීම අතිශයින් වැදගත් වේ .කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ළමා කම්කරුවන් යොදා ගැනීමට ඉඩිකඩ ඇති බැවින් එමඟින් බරපතල අනතුරු සහ තුවාල සිදුවිය හැක. | වැදගත් |
| **7.2.4.10 ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශය තුල පිහිටා ඇති ව්‍යාපාර, කෘෂිකාර්මික බිම් සහ අනෙකුත් ස්ථාන**<br>ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ආපදා අවම කිරීමේ ස්ථානය ආසන්නයේ පිහිටා ඇති වෙළඳසැල් සඳහා බලපෑම් ඇතිවිය හැක. | වැදගත් |
| **7.2.4.11 ප්‍රතිස්ථාපනය කල යුතු ප්‍රදේශයට යාබදව පිහිටා ඇති ව්‍යාපාර, කෘෂිකාර්මික බිම් සහ අනෙකුත් ස්ථාන**<br>ඉදිකිරීම් කාලය තුළ පහළ බෑවුම් ප්‍රදේශයේ ඇති තේ වගාවට බලපෑම් එල්ල විය හැක. | වැදගත් |
| **7.2.4.12 වැඩ බිමට පුද්ගලයින් ඇතුළු වීමේ හෝ ඒ හරහා ගමන් කිරීමේ අවශ්‍යතාව**<br>රෝගීන්ට සහ කාර්ය මණ්ඩලයට වෙනත් අරමුණු සඳහා වැඩබිමට ඇතුළු වීමට විශේෂ අවශ්‍යතාවයක් නොමැත. කෙසේ වෙතත්, චේතනාන්විතව හෝ නොදැනුවත්ව කාර්ය මණ්ඩලය හෝ සාමාන්‍ය පුද්ගලයින් අනවසරයෙන් වැඩබිමට ඇතුළුවීම සිදුවිය හැක. එවැනි අවස්ථාවකදී, යන්ත්‍රෝපකරණ, වාහන, විදුලිය සහ පිපිරුම් ද්‍රව්‍ය ක්‍රියාත්මක වීම හේතුවෙන් ඔවුන් අවදානමට ලක්විය හැකිය. | වැදගත් |

## 8. සැලකිය යුතු පාරිසරික සහ සමාජීය බලපෑම්

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) හි විශේෂ අවධානයන් අවශ්‍ය වන පාරිසරික, සමාජීය බලපෑම් හෝ අවදානම් තත්ත්වයන්.

### 8.1 මූලික සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටළු: කොන්ත්‍රාත්කරුවන් සඳහා සම්මත ගිවිසුම් අවශ්‍යතාවයන්ට අමතරව විශේෂිත සෞඛ්‍ය හා ආරක්ෂණ නිර්දේශයන්

බෑවුම් කඩාවැටීමේ අවදානමක් සහිත අස්ථායි බෑවුමකට ආසන්නව ශ්‍රමිකයින්ට වැඩ කිරීමට සිදුවන බැවින් මෙම වැඩබිමට අදාළව සෞඛ්‍යය හා ආරක්ෂණ ගැටළු පිළිබඳව දැඩි අවධානයක් යොමුකළ යුතුවේ. එබැවින් එකී පොදු සෞඛ්‍යය හා ආරක්ෂණ ගැටළු ESMF හීදී අවධානයට ලක්කර ඇත. ඉදිකිරීම් වැඩබිම් වලදී ශ්‍රමිකයින්ගේ ආරක්ෂණ අවශ්‍යතා පිළිබඳව 2003 දරණ සේවා කොන්දේසි, ප්‍රජා සෞඛ්‍යය හා ආරක්ෂාව සම්බන්ධ නිර්දේශ දක්වන ලංසු ලේඛනයේ 2003(5) වගන්තිය යටතේ ආරක්ෂිත උපාංග සහ පැළඳුම් පිළිබඳව සවිස්තරාත්මකව දක්වා ඇත.

### 8.2 ළමා හා බලහත්කාර ශ්‍රමය

2003 දරණ සේවා කොන්දේසි, ප්‍රජා සෞඛ්‍යය හා ආරක්ෂාව සම්බන්ධ නිර්දේශ දක්වන ලංසු ලේඛනයේ 2003.3 වගන්තිය යටතේ ළමා ශ්‍රමය සහ බලහත්කාර ශ්‍රමය පිළිබඳ සවිස්තරාත්මකව දක්වා ඇත.

## 9. පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව (ESMP)

මෙම කොටස යටතේ පෙර (07) හා (08) පරිච්ඡේද වලදී හඳුනාගන්නා ලද බලපෑම් සහ අවදානම් කළමනාකරණය හෝ අවමකරණය සඳහා අවශ්‍ය පාරිසරික හා සමාජයීය පියවර හා නිශ්චිත නිර්දේශයන් ඉදිකිරීම් ක්‍රියාවලියේ ප්‍රධාන අදියරයන් වන සැලසුම් අදියර, ඉදිකිරීම් අදියර සහ නඩත්තු මෙහෙයුම් අදියර යටතේ අන්තර්ගත කර ඇත.

### 9.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

ව්‍යාපෘතියට අදාලව මෙම ප්‍රදේශයේ නැවත පදිංචි කිරීම් සිදු කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවේ. ආපදා අවම කිරීමේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේදී බර යන්ත්‍රෝපකරණ භාවිතය නිසා ඇති විය හැකි භූ කම්පන හේතුවෙන් රෝහල් ගොඩනැගිලි වලට අලාභහානි සිදු විය හැක (හදිසියේ ඇතිවිය හැකි අලාභ හානි සඳහා වන්දි ගෙවීම් ක්‍රියාපටිපාටියක් සකස් කල යුතුය - යොමුව 2002.2.17.)

### 9.2 තාවකාලික ඉවත් කිරිම

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ අවදානම් සහිත ගොඩනැගිලිවලින් රෝගීන් ඉවත් කිරීමට අවශ්‍ය විය හැකිය. එසේම, ඉදිකිරීම් කාලය සඳහා අපදා අවම කිරීමේ ප්‍රදේශය "ඇතුල්වීම් තහනම් කලාපයක්" ලෙස නම් කළ යුතුය.

### 9.3 හානියට පත් ව්‍යුහයන් ඉවත් කිරීමේ ක්‍රියාපටිපාටිය, යටිතල පහසුකම් (හිමිකරුවන්ගේ ලිඛිත එකඟතාවය)

එවැනි අවශ්‍යතාවයක් ඇති නොවේ.

### 9.4 ව්‍යාපෘති හේතුවෙන් දේපල /භාවිතයන් අහිමි වීම සඳහා වන්දි ගෙවීම

ඉදිකිරීම් හේතුවෙන් රෝහල් ගොඩනැගිලිවලට, මාර්ගයට හෝ රෝහල් පරිශ්‍රයේ වෙනත් අංගයකට යම් හානියක් සිදුවුවහොත් වන්දි ගෙවීමට අවශ්‍ය විය හැකිය. ඉදිකිරීම් අතරතුර ජල මාර්ගයේ බාධා ඇති වුවහොත් රෝහලට අඛණ්ඩ ජල සැපයුමක් පවත්වා ගැනීම සඳහා විකල්ප ජල මූලාශ්‍ර සැපයීම අවශ්‍ය විය හැකිය.

### 9.5 මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබා දීම

නාය යෑම් හේතුවෙන් ඇති විය හැකි අවදානම් පිළිබඳව විශේෂයෙන් රෝහල් කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමත්, රෝගීන් සහ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීමේ පුවරුවක් ප්‍රදර්ශනය කිරීමත් නිර්දේශ කෙරේ.

### 9.6 සැලසුම් මත පදනම් වූ පාරිසරික /සමාජ කලමනාකරණ ක්‍රමවේදයන් සලකා බැලීම

පවතින පාරිසරික සහ සමාජීය අදාලත්වය සලකා බලමින් පාරිසරික සහ සමාජීය තත්ත්වය පිලිබඳ නිර්දේශ පහත වගුවේ ඉදිරිපත් කර ඇත.

වගුව **2:** සැලසුම් අදියරේදී පාරිසරික සහ සමාජීය සලකා බැලීම්

| **සැලසුම් අංගය** | **ව්‍යාපෘති ප්‍රදේශයට සලකා බැලීම සඳහා නිර්දේශිත මට්ටම** |
|---|---|
| **i. ස්වභාවික සම්පත් කළමනාකරණය සහ සම්පත් ප්‍රශස්ත ලෙස සැලසුම්කරණය**<br>වෘක්ෂලතාදිය ඉවත් කිරීම සහ වැඩුණු ශාක විශේෂ අවම වශයෙන් ඉවත් කිරීම සඳහා ව්‍යාපෘති විශේෂ සැලසුම් සලකා බැලිය යුතුය. වැදගත් ශාක විශේෂ හඳුනා ගතහොත් එම ශාක සංරක්ෂණය කිරීම පිලිබඳ ප්‍රමාණවත් අවධානයක් ඉදිරිපත් කල යුතුය. | අවම |
| **ii. වැඩ බිම සැලසුම් කිරීම**<br>යෝජිත ප්‍රදේශය සැලසුම් කිරීමේදී අස්ථාවර බෑවුම් සක්‍රිය වීම් හා පාංශු කොටස් චලනයන් සම්බන්ධයෙන් ප්‍රවේශම් විය යුතුය .එබැවින් රථ ගාල් ,ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථාන සහ තාවකාලික කුඩාරම් ආදිය අධි අවදානම් ප්‍රදේශ තුල ස්ථාපිත නොකිරීමට වගබලා ගත යුතුය. | ඉහළ |

| | |
|---|---|
| **iii. වාසස්ථාන සම්බන්ධතා සහ සත්ත්ව මංපෙත්**<br>ස්ථිර ඉදිකිරීම් සඳහා හෝ ප්‍රවේශය සඳහා හෝ ගැඹුරු කාණු පද්ධති සකස් කිරීම සඳහා හෝ පාරිසරික වශයෙන් සංවේදී වාසස්ථාන වල වෘක්ෂලතාදිය ඉවත් කිරීමට අවශ්‍ය නම් ,එම සම්බන්ධතා නොබිඳෙන ලෙස සත්ත්ව මංපෙත් සහ වෘක්ෂලතා තීරු සැලසුම් වල ඇතුලත් විය යුතුය. | අවම |
| **iv. ජල සම්පත සංරක්ෂණය**<br>බැවුම ස්ථාවර කිරීමේදී අත්‍යාවශය ක්‍රමවේදයක් වශයෙන් පිටතට ගන්නා ජලය හොඳ තත්වයේ හා ගුණාත්මක බැවින් යුතු වේ නම් එය රෝහලේ සහ පහළ බෑවුමේ ජීවත්වන ජනතාවගේ ගෙවතු වගාව සහ සනීපාරක්ෂක කටයුතු වැනි භාවිතයන් සඳහා යොදා ගත හැක. | ඉහළ |
| **v. ජල සැපයුමට බාධා සිදුවීම**<br>රෝහලට ජලය සපයන ජල මාර්ග මෙම අස්ථායී බෑවුම හරහා ගමන් කරයි. ආපදා අවම කිරීමේ සැලසුම් සකස් කිරීමේදී මේ පිළිබඳව සලකා බැලිය යුතු අතර, එම සැලසුම් මගින් බලපෑම් අවම කිරීමට උත්සාහ කළ යුතුය. | ඉහළ |
| **vi. සෞන්දර්යාත්මක නිර්මාණ සලකා බැලීම**<br>සෞන්දර්යාත්මක සංවේදී පරිසර නිර්මාණයේදී, රෝහල් පරිශ්‍රයේ ඇති ස්වභාවික පරිසරය හා සංකලනය වෙමින් දෘශ්‍ය පරිසර දූෂණය අවම මට්ටමක තබා ගැනීමට සැලසුම් කිරීම ට සැලකිලිමත් විය යුතුය. සුදුසු ව්‍යුහයන් සැලසුම් කිරීමේදී භූ දර්ශන සඳහා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ සේවය වැදගත් විය හැක. | ඉහළ |
| **vii. හරිත පාරිසරික ලක්ෂණ සලකා බැලීම**<br>ආපදා අවම කිරීමේ කටයුතු බොහොමයක් සිදුකරනු ලබන්නේ පරිසර හිතකාමී සංවේදී පරිසරයක් ඇති රෝහල් පරිශ්‍රයේ වල බැවින් පරිසර හිතකාමී හරිත පාරිසරික සැලසුම් පිළිබඳව හැකි තාක් සැලකිලිමත් වීම වඩාත් උචිතය .උදාහරණ ලෙස :පාංශු ඛාදනය පාලනය සඳහා දේශීය වෘක්ෂලතා විශේෂ භාවිතා කිරීම ,විශේෂ විවිධත්වය පවත්වා ගැනීම සඳහා ශාක සංයෝජනයන් යොදා ගැනීම සහ ආක්‍රමණශීලි සහ වෙනත් විශේෂ යොදා නොගැනීම. | ඉහළ |
| **viii. සේවක සහ ප්‍රජා ආරක්ෂාව**<br>බෑවුම සක්‍රිය වීම ඉදිකිරීම් අවදියේදී සිදුවිය හැකි බැවින් එය කම්කරුවන්ට සහ කාර්ය මණ්ඩලයට තර්ජනයක් විය හැකිය .එබැවින් ඔවුන්ගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා ආරක්ෂිත දැල්, ආරක්ෂිත වැටවල් වැනි සැලසුම් පදනම් කරගත් ආරක්ෂිත ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ සැලකිලිමත් විය යුතුය. | ඉතා ඉහල |
| **ix. ඛාදනය අවම කිරීමේ ව්‍යුහයන්**<br>වැසි කාලවලදී ජලාපවහනයේ වේගය සැලකිය යුතු ලෙස ඉහල යා හැකි අතර අස්ථායි බෑවුමේ ජලය පෘෂ්ටිය ගලයාමද වේගවත් විය හැක .මෙම ජලය අසල තිබෙන කාණු පද්ධති සඳහා යොමු කල යුතුය .එබැවින් බෑවුම වල ඛාදනය වන ප්‍රවාහ අඩු කිරීම සඳහා බාධකයන් දැමීම පිළිබඳව සැලකිලිමත් විය යුතුය. | ඉහළ |
| **x. අවම පසු නඩත්තු කිරීම් සහ මෙහෙයුම් සැලසුම් කිරීම**<br>හානිය අවම කිරීමේ කාර්යයේදී ජලාපවහන කළමනාකරණය සඳහා ගුරුත්ව කාණු වැනි අක්‍රිය ශිල්ප ක්‍රම (අමතර ශක්ති ප්‍රභවයක් අවශ්‍ය නොවන) පිළිබඳ සලකා බැලිය යුතුය. මෙහිදී කාණු අවහිර වීම් වලක්වා ගැනීමට නිවැරදි පයිප්ප විෂ්කම්භය, සිදුරු වල විෂ්කම්භය සහ ඇතිරීම් ආනතිය නිවැරදිව සලකා බැලිය යුතුය .කාණු ජලය ස්වාභාවික දහරාවන්ට එකතු කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඛාදනයට ඔරොත්තු දෙන, රොන් මඩ රඳවා ගැනීමේ පද්ධති ආදී නොයෙක් නඩත්තු ව්‍යුහ සැලසුම් කල යුතුය. දීර්ඝ කාලපරිච්ඡේදයක තුල කාලගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන පරිදි ව්‍යුහයන් සඳහා භාවිතා කරන ද්‍රව්‍ය ප්‍රවේශමෙන් තෝරා ගත යුතුය. වානේ ව්‍යුහයන් භාවිතා කිරීමේදී විශේෂයෙන් විඛාදය වැළක්වීමේ තාක්ෂණික ක්‍රම සැලසුම් කල යුතු අතර සියුම් රොන් මඩ උප නල මාර්ග වලට කාන්දු වීම වැළක්වීමට පියවර ගත යුතුය. | ඉහළ |

**9.7 ඉදිකිරීම් අදියර තුළ සිදුවන බලපෑම් අවම කිරීම**

**9.7.1 ඉදිකිරීම් අදියර තුළ පාරිසරික හා සමාජයීය කළමනාකරණය සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ අනුකූලතාවය.**

පාරිසරික සහ සමාජීය බලපෑම් අවම කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වන ක්‍රියාමාර්ග සාමාන්‍යයෙන් සියලු නායයෑම් අවදානම් අවම කිරීමේ ස්ථාන සඳහා පොදු වේ. එසේම, මෙම බලපෑම් බොහෝ දුරට ඉදිකිරීම් සඳහා බලපෑම් එල්ල කරන බැවින් එම බලපෑම් අවම කිරීම සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු කටයුතු කළයුතු වේ. මේ සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඉදිකිරීම් අදියරේදී පාරිසරික හා සමාජයීය සෞඛ්‍යය හා ආරක්ෂාව (E&HS) කළමනාකරණයට අනුකූල වීම සඳහා "කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය" පිළිබඳ පුළුල් ලේඛනයක් සකස් කර ඇත. එම ලේඛනයෙහි මෙම ස්ථානයට අදාළ ප්‍රධාන කොටස් සහ එහි අදාලත්වය පිළිබඳ පහත වගුවේ දැක්වේ (වගුව 3). එය ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුගේ ලංසු ලේඛනයේ ඉදිරිපත් කළ යුතුයි.

වගුව 3: ES & HS කළමනාකරණයට අනුකූල වීම සඳහා "කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය"

| ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුට අනුව ESMP යොමු අංකය | සංරචකය | ව්‍යාපෘතියට අදාලත්වය |
|---|---|---|
| **2002. පාරිසරික හා සමාජයීය අධීක්ෂණය** | | |
| 2002.2 1) | වැඩබිම තුළ ගබඩා කිරීම | බෙහෙවින් අදාළ වේ (රෝගීන්/ රෝහල් ගොඩනැගිලි) |
| 2002.2 2) | ශබ්ද හා කම්පන | බෙහෙවින් අදාළ වේ (රෝගීන්/ රෝහල් ගොඩනැගිලි) |
| 2002.2 3) | ගොඩනැගිලි ඉරිතැලීම් සහ හානි සිදු වීම | බෙහෙවින් අදාළ වේ (රෝහල් ගොඩනැගිලි) |
| 2002.2 4) | අපද්‍රව්‍ය බැහැර කිරීම | බෙහෙවින් අදාළ වේ (රෝහල් පරිශ්‍රය) |
| 2002.2 5) | කසල බැහැර කිරීම | බෙහෙවින් අදාළ වේ (රෝහල් පරිශ්‍රය) |
| 2002.2 6) | දූවිලි පාලනය කිරීම | බෙහෙවින් අදාළ වේ (රෝහල් පරිශ්‍රය) |
| 2002.2 7) | ඉදිකිරීම් ද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම | බෙහෙවින් අදාළ වේ (රෝහල් පරිශ්‍රය) |
| 2002.2 8) | ජලය | අදාළ වේ |
| 2002.2 9) | ශාක සහ සතුන් | සුළු වශයෙන් අදාළ වේ |
| 2002.2 10) | භෞතික සහ සංස්කෘතික සම්පත් | සුළු වශයෙන් අදාළ වේ |
| 2002.2 11) | පාංශු ඛාදනය | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 12) | පාංශු දූෂණය | අදාළ වේ |
| 2002.2 13) | පොලොව හෑරීම | අදාළ වේ |
| 2002.2 14) | ගල්වල මෙහෙයුම් | අදාළ වේ |
| 2002.2 15) | වාහන සහ යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව (දූෂණය) | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 16) | මහජනතාවට බාධා කිරීම | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 17) | උපයෝගිතා සේවා සහ මාර්ගයේ ඇති පහසුකම් | අදාළ වේ |
| 2002.2 18) | දෘශ්‍ය පරිසරය වැඩි දියුණු කිරීම | අදාළ වේ |
| **2002.5. පාරිසරික අධීක්ෂණය** | මූලික සමීක්ෂණය (වායු, ජලය, ශබ්දය, කම්පන සහ ඉරිතැලීම් සමීක්ෂණ ) | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න |
| | ඉදිකිරීම් අතරතුර සමීක්ෂණය (වායු, ජලය, ශබ්දය, කම්පන සහ ඉරිතැලීම් සමීක්ෂණ ) | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න |
| | වැඩබිම් මෙහෙයුම් කාලය තුළ සමීක්ෂණ | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න |
| | ලේඛන වාර්තා කිරීම සහ පවත්වාගෙන යාම | අදාළ වේ |
| **2003. සේවා කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව** | | |
| 2003.2 | ආරක්ෂාව පිළිබඳ සංවිධානකරණය සහ සංනිවේදනය | බෙහෙවින් අදාළ වේ (රෝගීන්/ කාර්ය මණ්ඩලය) |
| 2003.3 | ළමා ශ්‍රමය හා බලහත්කාර ශ්‍රමය | බෙහෙවින් අදාළ වේ |
| 2003.4 | ආරක්ෂාව පිළිබඳ වාර්තා සහ අනතුරු දැනුම්දීම | බෙහෙවින් අදාළ වේ (රෝහල් පරිශ්‍රය) |
| 2003.5 | ආරක්ෂිත උපකරණ හා ඇඳුම් පැළඳුම් | බෙහෙවින් අදාළ වේ (රෝහල් පරිශ්‍රය) |
| 2003.6 | ආරක්ෂාව පිළිබඳ නිරීක්ෂණය | බෙහෙවින් අදාළ වේ (රෝහල් පරිශ්‍රය) |
| 2003.7 | ප්‍රථමාධාර පහසුකම් | බෙහෙවින් අදාළ වේ (රෝහල් පරිශ්‍රය) |
| 2003.8 | සෞඛ්‍යය සහ ආරක්ෂිත තොරතුරු හා පුහුණුව | බෙහෙවින් අදාළ වේ (රෝහල් පරිශ්‍රය) |
| 2003.9 | සුරක්ෂිත සංවිධානය සහ සන්නිවේදනය | බෙහෙවින් අදාළ වේ (රෝහල් පරිශ්‍රය) |
| **අදාළ වේ**: සෑම ව්‍යාපෘති වැඩබිමකටම අදාළව භාවිත කළයුතු පොදු පාරිසරික හා සමාජයීය කළමනාකරණ මෙම කොටසින් දැක්වේ. | | |

**බෙහෙවින් අදාළ වේ**: ආපදා අවදානම අවමකරණ ස්ථානයට අදාළව සකස් කරන ලද *ESMP* සඳහා අනුකූල වන පරිදි පාරිසරික ප්‍රමිතීන් සකස් කිරීමට කොන්ත්‍රාත්කරු විසින් දැඩි අවධානයක් යොමු කළ යුතුය.
**අදාළ විය හැක**: ව්‍යාපෘති ක්‍රියාත්මක කරන කාලසීමාව *ESMP* හි පූර්ණ අවශ්‍යතා සඳහා මෙය අදාළ විය හැක.
**අදාළ නොවේ**: ස්ථානයේ ස්වභාවය මත මෙම කොටස් අදාළ නොවිය හැක.
**වෛකල්පිත**: අවශ්‍යතාවයකදී භාවිත කළ හැකිය.
**ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම**: මෙම සැලැස්ම තුළ පවත්නා අධීක්ෂණ කටයුතු සිදු කිරීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.
**පරිශීලනය**: *ESMP* ක්‍රියාත්මක කිරීම සඳහා වන කොන්ත්‍රාත්කරුගේ බැදීම.

## 9.7.2 ස්ථානීය විශේෂිත අවදානම අවමකරණය

ඉදිකිරීම් කාලයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ස්ථානීය විශේෂිත අවදානම් අවමකරණ පියවර පහත දැක්වේ.

වගුව 4: ස්ථානීය විශේෂිත ES & HS අවමකරණ පියවරයන්

| අවදානම් අවමකිරීමේ සංරචක | ව්‍යාපෘති අදියර | වගකීම |
|---|---|---|
| **i. ඉදිකිරීම් ක්‍රියාවලිය අතරතුර සිදුවන බාදන බලපෑම් අවම කිරීම**<br><br>ආපදා අවම කිරීමේ කටයුතු රෝහල් පරිශ්‍රයක සහ අස්ථායී බෑවුම් ප්‍රදේශයක සිදු කෙරේ. එබැවින්, වර්ෂා කාල සීමාවන්හීදී වැඩබිම එළි පෙහෙළි කිරීම, බෑවුම නැවත සකස් කිරීම සහ සුන්බුන් ඉවත් කිරීම වැනි කාර්යන්වල නොයෙදීම දැඩිව නිර්දේශ කෙරේ. එබැවින් ඉහළ බෑවුමේ ආපදා අවමකරණ කටයුතු වියළි කාල සීමාවන්හීදී පමණක් සිදුකිරීමට සහ වර්ෂා කාල සීමාවන්හීදී අස්ථායී බෑවුමේ එවැනි කටයුතු සිදු නොකිරීමට දැඩිව නිර්දේශ කෙරේ. මේ පිළිබඳව ව්‍යාපෘතිය සැලසුම් අදියරේදී අවධානය යොමුකළ යුතුය. තවද, බෑවුම සකස් කිරීමේදී රොන්මඩ ගලායාම වැලැක්වීම සඳහා රොන්මඩ තැන්පතු වැනි පාලන ක්‍රම හඳුන්වාදිය යුතුය. | වැඩබිම සකස් කිරීම හා ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **ii. ව්‍යාපෘති ක්‍රියාකාරකම් සැලසුම් කිරීම**<br><br>කොන්ත්‍රාත්කරු විසින් රෝහල් පරිශ්‍රයක් තුළ අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය. එබැවින්, රෝහල් පරිශ්‍ර තුළ ඉදිකිරීම් කටයුතු කළමනාකරණය කිරීම සඳහා මනා සැලැස්මක් ප්‍රවේශමෙන් සකස් කළ යුතුය. එම සැලැස්ම තුල වැඩබිමෙහි ඉඩ පහසුකම් උපරිමයෙන් උපයෝජනය වන හා ආරක්ෂාව උපරිම වන පරිදි ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම, රථ වාහන නැවැත්වීම, කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම සහ පිරිසිදු කිරීම වැනි දෑ ඇතුලත් විය යුතුය.<br><br>කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතුවල වපසරිය, කාල සැලැස්මක් සමඟ සාකච්ඡා කළ යුතු අතර ඉදිකිරීම් සැලැස්ම පිළිබඳව රෝහල් කළමනාකාරීත්වය ප්‍රමාණවත් ලෙස දැනුවත් කළ යුතුය. එසේම, වැඩකරන වේලාවන් පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්, සෞඛ්‍යය සේවා කටයුතු වලට ඇතිවන බාධා අවම කරගැනීම සඳහා දිස්ත්‍රික් වෛද්‍ය නිළධාරී සමඟ සාකච්ඡා කර සැලැස්මට අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. | වැඩබිම සකස් කිරීම හා ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **iii. ඇතුළුවීම තහනම් කලාප නම් කිරීම**<br><br>ඉදිකිරීම් අදියරේදී මෙම ස්ථානයේ බෑවුම් අස්ථාවර වීමේ අවදානම පිළිබඳව PMU විසින් සවිස්තරාත්මක තක්සේරුවක් කළ යුතුය. රෝගීන් සහ සාමාන්‍ය ජනතාව අනතුරුදායක කලාපයට ඇතුළු නොවන බව සහතික කිරීම සඳහා "ඇතුල්වීම් තහනම් කලාපයක්" ප්‍රකාශ කිරීමට අවශ්‍ය විය හැකිය.<br><br>එසේම වාහන ධාවනයේදී සිදුවන අනතුරු, යන්ත්‍රසූත්‍ර ක්‍රියාත්මක කිරීමේදී සිදුවන අනතුරු හා විදුලි කාන්දුවීම් ආදිය අවම කිරීම සඳහා සෞඛ්‍යය හා ආරක්ෂණ සැලැස්ම තුල ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදිය යුතු අතර විශේෂයෙන්ම රෝගීන්ට, සාමාන්‍ය ජනතාවට හා රෝහල් කාර්ය මණ්ඩලයට ඇති විය හැකි ඉහළ අවදානම් පිළිබඳව සලකා බැලිය යුතුය. මෙම අවම කිරීමේ ස්ථානය රෝහල් පරිශ්‍රය තුළ පිහිටා ඇති බැවින්, අනතුරු ඇඟවීමේ සංඥා සහ ස්ථිර පුහුණුව ලත් මුරකරුවන් සමඟ නිසි ආරක්ෂක පියවරයන් අනිවර්යයෙන් ඇතුළත් කළ යුතුය. | ඉදිකිරීම් අදියර | PMU හි E & S ඒකකය, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| **iv. ශබ්දය හා කම්පනය පාලනය**<br>ශබ්දය සහ කම්පන උත්පාදන ක්‍රියාකාරකම් රෝහලේ සේවාවන් පවත්වාගෙන යාම සඳහා බාධාවක් විය හැකිය. බොහෝ ගොඩනැගිලි බ්‍රිතාන්‍ය පාලන සමයේදී ඉදිකර ඇති බැවින් රෝහල් ගොඩනැගිලිවලට හානි නොවන පරිදි කම්පනය ජනනය කරන කටයුතු ඉතා ප්‍රවේශමෙන් සහ නියමිත කම්පන සීමාවන් තුළ සිදු කළ යුතුය. ගොඩනැගිලිවල පවතින ඉරිතැලීම් පිළිබඳ ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර, අතරතුර හා පසුව නිරීක්ෂණය කළයුතු අතර, ඉදිකිරීම් කටයුතු හේතුවෙන් යම් ගොඩනැගිල්ලකට හානි සිදුවුවහොත් ඊට සුදුසු වන්දි මුදලක් ලබාදිය යුතුය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **v. ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම**<br>ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු විශේෂ අවධානයක් යොමු කළ යුතුය. මෙම වැඩබිම රෝහල් පරිශ්‍රයක් තුළ ප්‍රසන්න හා පිරිසිදු පරිසරයක පිහිටා ඇත. එබැවින් එවැනි අපද්‍රව්‍ය ජනනය වුවහොත් ඒවා වැඩබිම තුළ බැහැර නොකළ යුතු අතර, වැඩබිම තුළ විධිමත්ව ගබඩා කර PMU විසින් අනුමත ක්‍රමවේදයක් හරහා නිසිලෙස බැහැර කළ යුතුය. ඉදිකිරීම් අපද්‍රව්‍ය රෝහල් පරිශ්‍රය තුළ, බැවුම් ප්‍රදේශවල හෝ මාර්ගය දිගේ කිසිඳු අවස්ථාවක බැහැර නොකළ යුතුය. | වැඩබිම සකස් කිරීම හා ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **vi. දූවිලි සහ වායු දූෂණය පාලනය කිරීම**<br>ඉදිකිරීම් කාලය තුළ ජනනය වන දූවිලි අංශු රෝහලේ රෝගීන්ට අහිතකර බලපෑම් ඇති කළ හැකිය. අධික දූවිලි හෝ දූවිලි අංශු ජනනය කිරීමේ ක්‍රියාකාරකම් අපේක්ෂා කරන්නේ නම් විශේෂිත අධීක්ෂණ ක්‍රමවේදයන් භාවිතා කළ යුතුය. | වැඩබිම සකස් කිරීම හා ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **vii. ඉදිකිරීම් සඳහා ජලය සහ විදුලිය ලබා ගැනීම**<br>ඉදිකිරීම් කටයුතු සඳහා ජලය ලබා ගත යුත්තේ අනුමත ස්ථානවලින් පමණි. කොන්ත්‍රාත්කරු රෝහලෙන් ජලය සහ විදුලිය භාවිතා කිරීමට අදහස් කරන්නේ නම්, රෝහල් කළමනාකාරිත්වය දැනුවත් කර අවශ්‍ය අවසරය ලබා ගත යුතුය. තවද, රෝහලේ ජල මූලාශ්‍රයෙන් ජලය ලබා ගැනීමට පෙර ජල අවශ්‍යතාවය සහ ලබාගත හැකිද යන්න පිළිබඳ තක්සේරුවක් සිදු කළ යුතුය. රෝහල් පරිපාලන කාර්ය මණ්ඩලයට අනුව පවතින ජල ප්‍රමාණය ඉදිකිරීම් කටයුතු සඳහාද භවිත කිරීමට ප්‍රමාණවත් නොවන අතර, එසේ භාවිත කිරීමෙන් යම්කිසි ජල හිඟතාවයක් ඇතිවුවහොත් එය සෘජුවම රෝහල් ක්‍රියාකාරිත්වයට බලපානු ඇත. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **viii. සෞඛ්‍යය හා ආරක්ෂාව සඳහා ප්‍රමුඛත්වය ලබාදීම**<br>මෙම ස්ථානයේ සේවකයින්ට ඉහළ අවදානම් තත්වයන් යටතේ වැඩ කිරීමට සිදු වන බැවින්, ESMP හි කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීම් දක්වන 2003 දරණ "සේවා කොන්දේසි, ප්‍රජා සෞඛ්‍යය සහ ආරක්ෂාව" ය්අන වගන්තිය යටතේ දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. නිසි සංවිධානයක් සහ ආරක්ෂක අධීක්ෂණ පද්ධතියක් තුළ මෙම නිර්දේශයන් අනුගමනය කළ යුතුය.<br>i. මීට අමතරව, අස්ථායී බෑවුම්වල වැඩ කිරීම වැසි සමයේදී ඉතා අවදානම් සහිත බැවින් වැසි කාලවලදී ප්‍රමාණවත් කාලයක් සඳහා වැඩ නතර කළ යුතුය.<br>ii. හොඳ අනතුරු ඇඟවීමේ පද්ධතියක් සහ පූර්ණ කාලීන මුරකරුවන් මෙම වැඩබිම සඳහා කම්කරුවන්ගේ, රෝගීන්ගේ සහ රෝහල් කාර්යය මණ්ඩලයේ ආරක්ෂාව සඳහා අනිවාර්යෙන් නිර්දේශ කරනු ලැබේ.<br>iii. සේවකයින් සහ මහජනතාව ආරක්ෂා කිරීම සඳහා අවදානම් ස්ථානවල ආරක්ෂිත බාධක සහ ආරක්ෂිත දැල් සවි කළ යුතුය. | ඉදිකිරීම් අදියර | PMU හි E & S ඒකකය, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| **ix. ආරක්ෂිත ව්‍යුහයන්/ සංඥා පුවරු**<br>ඉදිකිරීම් අදියරේදී ඉහළ බෑවුම් ප්‍රදේශවලින් කම්කරුවන් වැටීමේ අවදානම වැළැක්වීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂිත වැටවල් ස්ථාපිත කළ යුතුය. අස්ථායී බෑවුම් ප්‍රදේශයේ, බෑවුමේ අස්ථායීතා අවදානම දැක්වෙන අනතුරු ඇඟවීමේ පුවරු තැබිය යුතුය. ඉදිකිරීම් කටයුතු සිදු නොවන වර්ෂා කාලවලදීද අවදානම වැඩි බැවින් ව්‍යාපෘති නොමැති කාලසීමාව තුළද ආරක්ෂිත සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය වේ. | ඉදිකිරීම් අදියර | PMU හි E & S ඒකකය, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **x. රෝහල් පරිශ්‍රයේ ජල සැපයුමට බාධා ඇතිවීම අවම කිරීම**<br>දැනට මෙම ස්ථානය හරහා ගමන් කරන ජල මාර්ග ඉදිකිරීම් අදියරේදී බලපෑමට ලක් නොවී නිසි ලෙස තිබිය යුතුය. ජල සැපයුමට බාධාවක් ඇති වුවහොත් විකල්ප ජල සැපයුමක් ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය. ජල මාර්ග ආරක්ෂිත ස්ථානයකට මාරු කිරීමේ අවශ්‍යතාවයක් ඇතිවුවහොත් ව්‍යාපෘති මූලික අදියරේදී රෝහල් කළමනාකාරිත්වයට දැනුම් දිය යුතුය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xi. කොන්ත්‍රාත්කරු යටතේ සිටින සේවකයින්ගේ සනීපාරක්ෂක පහසුකම් භාවිතය**<br>කොන්ත්‍රාත්කරු යටතේ සිටින සේවකයන් සඳහා වෙනම සනීපාරක්ෂක පහසුකම් සකස් කළ යුතුය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xii. ඉදිකිරීම් කටයුතු සිදුකරන කාලය**<br>ඉදිකිරීම් කටයුතු රෝහල් කළමනාකාරිත්වයට අනුකූල විය යුතුය. ව්‍යාපෘති ඉලක්ක සපුරා ගැනීම සඳහා රාත්‍රී කාලයේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය නම්, එම කටයුතු ප්‍රමාණවත් ආරක්ෂිත පියවරයන් සහ රෝහල් කළමනාකාරිත්වයේ අනුමැතිය යටතේ සිදු කළ යුතුය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xiii. ජනතාව මෙම ප්‍රදේශයට ඇතුළුවීම හෝ ඒ හරහා ගමන් කිරීමේ අවශ්‍යතාවය**<br>පූර්ණ කාලීන මුරකරුවන් යෙදවීම, අනතුරු ඇඟවීමේ සංඥා පුවරු මඟින් සහ සුපරීක්ෂාකාරී වීම මගින් මෙම ස්ථානයට ඇතුළුවිය හැකි අනවසර ප්‍රවේශය වැළැක්විය යුතුය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xiv. ක්‍රමවත් ගෘහ පාලනය** - ඉදිකිරීම් අතරතුර හොඳ ගෘහ පාලනයක් පවත්වාගෙන යාම හරහා ද්‍රව්‍යා දූෂණය අවම කළ යුතුය. | වැඩබිම සකස් කිරීම හා ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |
| **xv. සේවක චර්යා ධර්ම පද්ධතියක් පවත්වාගෙන යාම**<br>කොන්ත්‍රාත්කරු විසින් යෝග්‍ය සේවක ආචාර ධර්ම පද්ධතියක් පවත්වාගෙන යාමෙන් වැඩබිම් සේවකයන් සහ රෝගීන්, කාර්ය මණ්ඩලය, සාමාන්‍ය ජනතාව සහ ප්‍රජාව අතර ඇති විය හැකි ආරවුල් වළක්වා ගත යුතුය. | ඉදිකිරීම් අදියර | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු |

### 9.7.3 වැඩබිම සඳහා වන අධීක්ෂණ අවශ්‍යතා

පහත දැක්වෙන අධීක්ෂණ සැලැස්ම ඉදිකිරීම් අදියරේදී මෙම වැඩබිමට විශේෂිත වූ අධීක්ෂණ සැලැස්මකි. මීට අමතරව, කොන්ත්‍රාත්කරුවන්ගේ ESMP සඳහා ඇති අනනුකූලතාවය දක්වා ඇති අධීක්ෂණ ක්‍රියාපටිපාටිය ඒ ආකාරයෙන්ම ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කළ යුතුය. කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ESMP ක්‍රියාපටිපාටිය ලංසු ලේඛනයේ සඳහන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ESMP සඳහා වන පිරිවැය වෙනම ගෙවුම් අයිතමයක් ලෙස දැක්වීමට අවශ්‍ය වේ. තෝරාගත් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික හා සමාජ කළමනාකරණ ක්‍රමවේද පිළිබඳ ප්‍රකාශනයක් ඉදිරිපත් කළයුතු අතර PMU විසින් එය අනුමත කිරීම අවශ්‍යය වේ.

වගුව 5: ඉදිකිරීම් අදියර සඳහා පාරිසරික හා සමාජයීය අධීක්ෂණ යාන්ත්‍රණය

| අධීක්ෂණ අවශ්‍යතා | පරාමිතීන් | අධීක්ෂණය කළයුතු වාර ගණන |
|---|---|---|
| i. මූලික නිරීක්ෂණ | ජලයේ ගුණාත්මකභාවය | එක් වරක් * |
| | අවදානමක් සහිත නිවාස වල පූර්ව ඉරිතැලීම් සමීක්ෂණ | එක් වරක් * |
| | භූ කම්පන | එක් වරක් * |
| | වාතයේ ගුණාත්මකභාවය -අංශු ප්‍රමාණය | එක් වරක් * |
| | වැඩබිමෙහි ශබ්දය මිනුම් කිරීම | එක් වරක් * |
| ii. ඉදි කිරීම් කාලය අතරතුර | ජලයේ ගුණාත්මකභාවය | - |
| | අවදානමක් සහිත ගොඩනැගිලිවල ඉරිතැලීම් ලක්ෂණ | එක් වරක් * |
| | භූ කම්පන | භූ විදුම්, භූ කැණීම් හෝ කම්පන ජනනය වන ඕනෑම කාර්යයක් සිදු කිරීමේදී* |
| | වැඩබිමෙහි ශබ්දය මිනුම් කිරීම | අධික ශබ්ද උත්පාදනය වන කාලවලදී මසකට වරක් * |
| | වාතයේ ගුණාත්මකභාවය -අංශු ප්‍රමාණය | අධික වායු දූෂණය ජනනය වන කාලවලදී* |
| iii. වායු විමෝචනය | ක්‍රියාත්මක වන සියලු යන්ත්‍රෝපකරණ /වාහන විමෝචන පාලන පරීක්ෂණ සහතිකය අදාළ පරිදි ලබා ගත යුතුය. ව්‍යාපෘති උපදේශකයන්ගේ ස්ථාන භාර ES විසින් පරීක්ෂා කල යුතුය. | |
| iv. නිරීක්ෂණ ආයතන | * ඉරිතැලීම් සමීක්ෂණ හැර අනෙකුත් සියලුම පරාමිතීන් අධ්‍යනය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි ස්වාධීන නිරීක්ෂණ ආයතනයක් යොදා ගත යුතුය.<br>**ඉරිතැලීම් පිළිබඳ සමීක්ෂණය සිදු කිරීම සඳහා PMU මඟින් අනුමැත ආයතනයක් මඟින් සිදු කළ යුතුය. | |
| v. වාර්තා කිරීමේ අවශ්‍යතා | **ස්වභාවික ඇල මාර්ග වල ජලයේ ගුණාත්මක භාවය** – මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2017 වර්ෂයේ ප්‍රකාශයට පත්කරන ලද ස්වභාවික ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ සම්මතයන් සමඟ සංසන්දනය කිරීම<br>**භූ කම්පන** -යන්ත්‍ර සූත්‍ර භාවිතය ,ඉදිකිරීම් ක්‍රියාකාරකම් සහ රථවාහන ධාවනය මඟින් භූමිය මත ඇතිවන කම්පන තත්ව පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඉදිරිපත් කර ඇති අන්තර් ප්‍රමිතීන්.<br>**පසුබිම් ශබ්ද මිනුම් කිරීම** – 1996 මැයි 23 දිනැති අංක 924.1 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මධ්‍යම පරිසර අධිකාරිය<br>**වායු වල ගුණාත්මකභාවය, අංශු පරීක්ෂාව** - 2008 අගෝස්තු මස 15 වන දින අංක 1562/22 දරණ අති විශේෂ ගැසට් පත්‍රය යටතේ නිකුත් කර ඇති ජාතික වායු ගුණත්මකභාවය පිළිබඳ සම්මතයන - මධ්‍යම පරිසර අධිකාරිය | |

## 10. මහජනතාවගේ සහ පාර්ශවකරුවන්ගේ අදහස් - පවත්වා ඇති සහ/හෝ පැවැත්වීමට අදහස් කරන

මෙම ආපදා අවම කිරීමේ ස්ථානය රෝහල් පරිශ්‍රයක පිහිටා ඇත. එබැවින් දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීවරයාගේ උපදෙස් පරිදි ක්ෂේත්‍ර චාරිකාවේදී රෝහල් පරිපාලන කාර්ය මණ්ඩලයේ උපදෙස් ලබා ගන්නා ලදී. රෝහලේ පරිපාලන අංශයේ සංවර්ධන නිලධාරී මධුරංග මහතා පවසන පරිදි මෙම රෝහල දැඩි සත්කාර ඒකකයක් සහ මාතෘ වාට්ටුවක් සහිත ප්‍රදේශයේ ප්‍රධානතම රෝහල බව සඳහන් කරයි. එබැවින් මෙම රෝහල් පරිශ්‍රය තුල ඇති ආපදා මට්ටම අවම කිරීම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට ඉතා ප්‍රයෝජනවත්ය. තවද මෙම ආපදා අවම කිරීමේ ක්‍රියාවලිය සහ අරමුදල් යාන්ත්‍රණය පිළිබඳව ඔවුන් දැනුවත් කරන ලදි. මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය ඕනෑම සහයෝගයක් ලබා දීමට ඔහු එකඟ විය.

තවද, කොටපොල ප්‍රාදේශීය සභාවේ සභාපති දයානන්ද මහතාගෙන්ද අදහස් ලබාගත් අතර, යෝජිත අවම කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳව ද ඔහු දැනුවත් කරන ලදි. බෑවුම් කඩා වැටීම හේතුවෙන් රෝහල ආරක්ෂිත ස්ථානයකට ගෙන යාමට යෝජනා කළ නමුත් ඒ සඳහා සුදුසු ආරක්ෂිත ඉඩම් නිදහස් කර ගැනීමේ ගැටලුවක් පවතින බව ඔහු සඳහන් කළේය. එබැවින්, මෙම ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය ඉතා වැදගත් බව ඔහු ප්‍රකාශ කරන ලදි.

## 11. ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍යය අධිකාරිය විසින් නිකුත් කරන ලද කොවිඩ් - 19 වෛරසය වැළැක්වීමේ පියවර

කොවිඩ් 19 වෛරස් ආසාදනය ලොව මුළුමනින්ම තුරන් කර නොමැත. එබැවින් මෙම වෛරසය ව්‍යාප්ත වීම වැළැක්වීමට/ පාලනය කිරීමට සහ යම් වෛරස් ආසාදන තත්වයක් හඳුනා ගැනීමේදී කලබලයට පත්වීම වැළැක්වීමට සියළුම කොන්ත්‍රාත්කරුවන් විසින් කොවිඩ් - 19 පූර්ව සූදානම් වීමේ සැලැස්මක් සකස් කළ යුතු අතර 2021 ජනවාරි

මස CIDA ආයතනය විසින් නිකුත් කරන ලද "ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගත කාලය තුළ ඉදිකිරීම් වැඩබිම් තුළ අනුගමනය කළයුතු සෞඛ්‍යය හා ආරක්ෂණ මාර්ගෝපදේශය" (4වන සංශෝදනය) අනුව එම සැලැස්ම ව්‍යාපෘති වැඩබිම් තුළ ක්‍රියාත්මක කළ යුතුය.

## 12. කම්කරු කළමනාකරණය

නිසි සේවක කළමනාකරණ සබඳතා පවත්වා ගනිමින් ව්‍යාපෘතියේ සේවකයන්ට සාධාරණ ලෙස සැලකීමට මෙන්ම ආරක්ෂිත සහ සෞඛ්‍යය සම්පන්න සේවා පහසුකම් සැපයීමේ වගකීම PMU සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු සතුය.

එහි ප්‍රධානතම අරමුණු වන්නේ,

- රැකියාවේ ආරක්ෂාව සහ සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම
- ව්‍යාපෘති සේවකයින්ගේ සාධාරණ සැලකීම, වෙනස් කොට නොසැලකීම සහ සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීම.
- කාන්තාවන්, ආබාධ සහිත පුද්ගලයින්, ළමුන් සහ සංක්‍රමණික සේවකයින් වැනි අවදානමට ලක්විය හැකි සේවකයින් ඇතුළු සියළුම ව්‍යාපෘති සේවකයින් සුදුසු පරිදි ආරක්ෂා කිරීම.
- සියළුම ආකාරයේ බලහත්කාර ශ්‍රමය සහ ළමා ශ්‍රමය භාවිතය වැලැක්වීම.
- ජාතික නීතිවලට අනුකූල වන පරිදි ව්‍යාපෘති සේවකයින්ගේ සංගමයේ නිදහස සහ සාමූහික කේවල් කිරීමේ මූලධර්ම වලට සහය වීම.
- ව්‍යාපෘති සේවකයන්ට රැකියා ස්ථානයේ ගැටළු මතු කිරීමට ප්‍රවේශ විය හැකි අවස්ථා ලබාදීම.

## 13. නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාව සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයතනයන්හි අනුමැතිය ලබා ගැනීම

වගුව 6: නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාව සහ අනුමැතිය

| අවශ්‍යතා / අනුමත කිරීම / ආයතන | ව්‍යාපෘතියට ඇති අදාළත්වය |
|---|---|
| **13.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම** | |
| දිස්ත්‍රික් ලේකම් හා දිස්ත්‍රික් සංවර්ධන සම්බන්ධිකරණ කමිටුවේ අනුමැතිය | ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට දිස්ත්‍රික් ලේකම් වරයාගේ අනුමැතිය ලබා ගැනීමට සිදුවනු ඇති අතර මෙහිදී දේශපාලන අධිකාරිය සහ දිස්ත්‍රික්කයේ වගකිව යුතු ආයතන සහභාගී වන දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව හමුවේ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කල යුතු වේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නිලධාරියෙකු ව්‍යාපෘතිය පිලිබඳ විස්තර කරමින් එහි විවිධ පාරිසරික සහ සමාජීයය ගැටළු ආදිය ගැන සාකච්ඡා කරනු ඇත. මෙහිදී වැඩි අවධානයක් යොමුවන ගැටළු පිළිබඳව පැහැදිලි කරනු ලැබේ. මෙම රැස්වීමේදී ගනු ලබන නිර්දේශ මෙම පාරිසරික සහ සමාජීයය කළමනාකරණ සැලසුම ක්‍රියාවට නංවන විට සැලකිල්ලට ගැනෙනු ඇත. |
| සැලසුම් කමිටුවේ අනුමැතිය | මෙම ව්‍යාපෘතියට කොටපොල ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු වනු ඇත . |
| **13.2 ව්‍යාපෘතියට අදාළ රජයේ/ ඉඩම් හිමියන්ගේ අනුමැතිය** | |
| මධ්‍යම පරිසර අධිකාරිය | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගැනීම අවශ්‍ය වේ. |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වනජීවී කලාප හෝ සංරක්ෂිත වනාන්තර කිසිවක් නොමැති බැවින් වනසංරක්ෂණ දෙපාර්තුමේන්තුවෙන් හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුවෙන් අවසර ලබා ගත යුතු නැත. |
| භූ විද්‍යා සහ සහ පතල් කාර්යාංශය | පාෂාණ, ඛනිජ වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය ලබා ගැනීමට, ප්‍රවාහනයට සහ ඉවත් කිරීමට අනුමැතිය ලබා ගැනීම. (අවශ්‍යනම් පමණක් ). |

| | |
|---|---|
| කොටපොල ප්‍රාදේශීය සභාව | අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා කොටපොල ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය ලබා ගත යුතුය. |
| ලංකා විදුලි බලමණ්ඩලය | ව්‍යාපෘති ස්ථානය සඳහා විදුලි බලය ලබාගැනීමට විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයෙන් අවසර ලබා ගත යුතුය. |
| **13.3 ඉඩම් හිමිකාරීත්වයෙන් කැමැත්ත/ විරුද්ධත්වයක් නොමැති බව/ නීත්‍යානුකූල ගිවිසුම** | |
| ඉඩම් හිමිකරු (සෞඛ්‍යය අමාත්‍යාංශය) | ව්‍යුහයන් ඉවත් කිරීමට, ඉඩමට ප්‍රවේශ වීමට, ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට සහ දිගුකාලීන නඩත්තු කටයුතුවල නිරතවීමට කිසිදු විරෝධයක් නොදක්වන බවට ඉඩම් හිමියා (සෞඛ්‍යය අමාත්‍යාංශය) සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය අතර නීත්‍යානුකූලව ගිවිසුමක් අත්සන් කෙරේ. |

අනුමැතිය ලබා ගැනීම සඳහා වූ තාවකාලික කාලරාමුව වගුව 7 හි දක්වා ඇත.

වගුව 7: අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත (තාවකාලික) කාලරාමුව

| **අනුමැතිය ලබා ගැනීම** | **මාසය 1** | | | | **මාසය 2** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සතිය 01 | සතිය 02 | සතිය 03 | සතිය 04 | සතිය 01 | සතිය 02 | සතිය 03 | සතිය 04 |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**<br>***දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම***<br>අයදුම්පත ඉදිරිපත් කිරීම<br>ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීම<br>ගැටළු නිරාකරණය කර ගැනීම<br>අනුමැතිය | | | | | | | | |
| **සැලසුම් කමිටුවේ අනුමැතිය**<br>අයදුම්පත ඉදිරිපත් කිරීම<br>ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීම<br>ගැටළු නිරාකරණය කර ගැනීම<br>අනුමැතිය | | | | | | | | |
| ***විදුලිබල මංඩලයේ, සෞඛ්‍යය අමාත්‍යාංශයේ හා කොටපොල ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගැනීම.***<br>අයදුම්පත ඉදිරිපත් කිරීම<br>ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීම<br>ගැටළු නිරාකරණය කර ගැනීම<br>අනුමැතිය | | | | | | | | |
| **අනෙකුත් අනුමැතීන් ලබාගැනීම**<br>CEA<br>GSMB | | | | | | | | |
| ඉඩම් හිමිකරුවන්ගේ කැමැත්ත /විරෝධතාවයක් නොමැති බව (රෝහල් කළමනාකාරිත්වය/ සෞඛ්‍යය අමාත්‍යාංශය) | | | | | | | | |

## 14. මෙම ව්‍යාපෘතිය සම්බන්ධ අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය

මෙම ව්‍යාපෘතිය හේතුවෙන් සිදුවිය හැකි ගැටළු සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩල පිහිටුවීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික හා සමාජයීය නිලධාරී විසින් සිදු කල යුතුය. (අභියාචනා මණ්ඩල පිහිටුවීමට අදාල නිර්දේශ පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව (ESMF) යටතේ සපයා ඇත.)

සමාජීය සහ පාරිසරික ගැටළු සම්බන්ධ සියලුම පැමිණිලි වාචිකව/දුරකථනයෙන් හෝ ලිඛිතව පහත පුද්ගලයා/ස්ථානය වෙත එවීමට හැකිය.

- ව්‍යාපෘති අධ්‍යක්ෂ/ RLVMMP
    - දුරකතනය : +94 112 559 869
    - ෆැක්ස් : +94 112 502 611
    - විද්‍යුත් තැපැල : pd.rlvmmp@gmail.com
    - වෙබ් අඩවිය : rlvmmp.lk
- දිස්ත්‍රික් නිළධාරී/ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) හෝ
- වැඩබිම් නිළධාරී/ RLVMMP
- මාර්ගගත අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය (https://rlvmmo.lk/grms)

## 15. ව්‍යාපෘති තොරතුරු නිකුත් කිරීම

පහත දැක්වෙන ආයතන හා සංවිධාන වෙත අවම වශයෙන් පහත වගුවේ දක්වා ඇති පරිදි ව්‍යාපෘතියේ පාරිසරික හා සමාජයීය තොරතුරු නිකුත් කිරීම PMU හි වගකීම වේ.

වගුව 8: යෝජිත තොරතුරු බෙදා හැරීමේ යාන්ත්‍රණය

| තොරතුරු | යෝජිත ආයතන | තොරතුරු අනාවරණය කිරීමේ ක්‍රමවේදය |
|---|---|---|
| i. ව්‍යාපෘති සැලැස්ම (ස්ථානීය තොරතුරු ,පිරිසැලසුම, ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද) | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය ,දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් වෛද්‍ය නිළධාරී, අනෙකුත් දිස්ත්‍රික්ක මට්ටමේ නියෝජිතායතන, ජා.ගො.ප.සං.යේ දිස්ත්‍රික් කාර්යාලය, AIIB බැංකුව. | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, ගිවිසුම් සඳහා අදාළ වාර්තා ඉදිරිපත් කිරීම, අනුමැතිය හා එකගතාවය ලබාගනීම. |
| ii. පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලැස්ම | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, AIIB බැංකුව. | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, ගිවිසුම් සඳහා අදාළ වාර්තා ඉදිරිපත් කිරීම, අනුමැතිය හා එකගතාවය ලබාගනීම. |
| iii. අධීක්ෂණ වාර්තා (මුලික සහ ඉදිකිරීම් කාලය තුල) | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, AIIB බැංකුව සහ අදාළ පාර්ශවයන් | ප්‍රගති සමාලෝචන රැස්වීම්, විශේෂ රැස්වීම්, අදාළ වාර්තා ඉදිරිපත් කිරීම. |
| iv. පාරිසරික අනුකූලතාවය සහ ශ්‍රමිකයින්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිලිබඳව ස්ථානීය පරික්ෂාව | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාමනිලධාරී, ජා.ගො.ප.සං.යේ දිස්ත්‍රික් කාර්යාලය, AIIB බැංකුව සහ අදාළ පාර්ශවයන් | ලිඛිත සහ වාචික සන්නිවේදනය, අදාළ වාර්තා ඉදිරිපත් කිරීම. |
| v. පාරිසරික හා සෞඛ්‍යය කරුණු සම්බන්ධව ගනුලැබූ තීරණ හා ප්‍රගති සමාලෝචන රැස්වීම් | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරිය, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් වෛද්‍ය නිළධාරී, ආගමික නායකයින්, ග්‍රාමනිලධාරී , ජා.ගො.ප.සං.යේ දිස්ත්‍රික් කාර්යාලය, AIIB බැංකුව සහ අදාළ පාර්ශවයන්. | රැස්වීම්, අදාළ වාර්තා ඉදිරිපත් කිරීම. |
| vi. අභියාචනා සලකා බැලිමේ යාන්ත්‍රනය | AIIB බැංකුව සහ අදාළ පාර්ශවයන් | රැස්වීම්, ලිඛිත හා වාචික සන්නිවේදනය. |

## ඇමුණුම 1: හඳුනාගත් ස්ථානයේ ස්වභාවය සහ උපදේශන

| | |
|---|---|
|  |  |
| රෝහල් කාර්යය මංඩලය සහ වෙළඳසල් හිමියන්ගේ අදහස් ලබාගැනීම | අවමකරණ ස්ථානය අසල ඇති පැරණි රෝහල් ගොඩනැගිල්ල |
|  |  |
| රෝහල් ගොඩනැගිලි මත ඇති ඉරිතැලීම් | රෝහල් ගොඩනැගිලි |